

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

(PGIIM)

කොළඹ විශ්වවිද්‍යාලය

2020 වාර්ෂික වාර්තාව සහ ගිණුම්

දැක්ම

රටේ සෞඛ්‍ය අවශ්‍යතාවන් සපුරාලීම සහ
ප්‍රතිචාරාත්මක ආකාරයකින්
කලාපීය සහ ගෝලීය සෞඛ්‍ය වෙනුවෙන් කැපවීම
පිණිස ඉහළ වෘත්තීමය ප්‍රමිතීන් අත්කර ගත්
ආයුර්වේදය, යුනානි, සිද්ධ සහ සාම්ප්‍රදායක
සෞඛ්‍ය විශේෂඥයින් බිහි කරන විශිෂ්ටත්වයේ
කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම

මෙහෙවර

ශ්‍රී ලංකාවේ, කලාපයේ සහ ලෝකයේ ජනතාව
වෙනුවෙන් ප්‍රශස්ත මානුෂීය සෞඛ්‍ය රැකවරණයක්
ලබාදීම පිණිස
විශිෂ්ට සායනික සහ පර්යේෂණ නිපුණතාවලින් සවිබල,
ආයුර්වේදය, යුනානි, සිද්ධ සහ සාම්ප්‍රදායක
වෛද්‍ය ක්‍රම පිළිබඳ දැනුම සහ කුසලතා ඇති
විශේෂඥයින් බිහි කිරීම

අධ්‍යක්ෂවරයාගේ පණිවුඩය



ශ්‍රී ලංකාව, බටහිර වෛද්‍ය ක්‍රමය හඳුන්වාදීමට බොහෝ කාලයකට පෙර සිට ඉතා පරිපූර්ණ වෛද්‍ය සත්කාර ක්‍රමයක පෞඩ ඉතිහාසයක් උරුම කර ගත් දිවයිනකි. ශ්‍රී ලංකාවේ මිහින්තලය ප්‍රදේශයේ දී ලෝකයේ ඓතිහාසික රෝහලක් පිහිටා තිබූ බවට පුරාවිද්‍යාත්මක සාක්ෂි තහවුරු කරයි. මෙවැනි පසුබිමක් තුළ සිටිමින් අපි, 2020 වර්ෂය සඳහා වූ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන්නෙමු.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිළිබඳ ප්‍රඥප්තිය 2017 වර්ෂයේ දී ගැසට් කරනු ලැබීමත් සමඟ එම වර්ෂයේ දී ආයතනය පිහිටුවනු ලැබුව ද ආයතනයේ අධ්‍යයන කටයුතු ආරම්භ කරනු ලැබුවේ 2020 වර්ෂයේ සිට වේ. ඒ අනුව විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් පහක් වැඩ කටයුතු 2020 වර්ෂය තුළ දී ආරම්භ කිරීම ප්‍රධානතම කර්තව්‍ය විය. ආයතනයේ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම සඳහා සපුරාලිය යුතු අත්‍යාවශ්‍ය අංගයක් වූ අධ්‍යයන වැඩසටහන් ආරම්භ කිරීම අධ්‍යයන පාඨමාලා හතරක් සෙනෙට් සභාව මඟින් අනුමත කරනු ලදී. 2020 වසර තුළ දී ආයතනය ඉටු කළ කාර්යභාරය පිළිබඳ වැඩිදුර විස්තර මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි පරිපාලන කාර්යයන් සඳහා සහ විශේෂඥ වෛද්‍ය උපාධි පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ 5වැනි මහළ භාවිතා කරනු ලබයි.මෙයට අමතරව, පශ්චාත්-උපාධි ශිෂ්‍යයින්ගේ සායනික පුහුණුව සඳහා මහපාදමින් ආයතනයේ අධ්‍යයන හා පුහුණු කටයුතු පවත්වාගෙන යාමට ආයුර්වේද රෝහල සහ එහි කාර්ය මණ්ඩලය යොදා ගනු ලබයි.

කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් 2020 වර්ෂය උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් අභියෝගාත්මක වර්ෂයක් විය. අධ්‍යාපන වැඩසටහන්වල සුමට ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම පිණිස අපට විශේෂිත ක්‍රමෝපායන් අනුගමනය කිරීමට සිදු වෙයි. එමෙන්ම පද්ධතිය ශක්තිමත් කිරීමෙන් අධ්‍යාපන වැඩසටහන්වල කාර්යක්ෂමතාව සහ ගුණාත්මකභාවය වැඩි කිරීමට හැකි වනු ඇත. සේවක සංඛ්‍යාවේ ඉතිරි බඳවා ගැනීම් සහ වෙනත් ද්‍රව්‍යමය අවශ්‍යතාවන් ප්‍රසම්පාදනය සිදු කිරීම වැනි අනෙකුත් වැඩිදියුණු කිරීම් සිදුකර ආයතනයේ ඵලදායී ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීම සඳහා ඉටු කළ යුතු වේ. ඒ අනුව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය නවමු ආකෘතියක් සමඟ දිවයින තුළ විශිෂ්ටත්වයට පත්වීමත් සමඟ විශේෂඥ දේශීය වෛද්‍ය සේවාවන්ට නව ජීවයක් එකතු කිරීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කරන්නෙමු.

මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන

අධ්‍යක්ෂ

පටුන

1. ආයතනය 1

1.1 කෙටි හැඳින්වීම 1

1.2 ආයතනයේ අධ්‍යක්ෂවරයා 4

1.3 කළමනාකරණ මණ්ඩලය 4

1.4 මූල්‍ය කමිටුව 6

1.5 අධ්‍යයන මණ්ඩල 6

1.5.1 **අධ්‍යයන මණ්ඩල** 6

1.5.2 විශේෂඥ මණ්ඩල 7

2. 2020 වර්ෂය තුළ අධ්‍යයන කටයුතු 9

2.1 ශිෂ්‍යයින් ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තර 9

2.1.1 **විශේෂඥ ක්ෂේත්‍ර අනුව ශිෂ්‍යයින් ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තර** 10

2.1.2 **ස්ත්‍රී-පුරුෂභාවය අනුව ශිෂ්‍යයින් ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තර.** 11

2.2 පුහුණු මධ්‍යස්ථාන, පුහුණුකරුවන් සහ පුහුණුවන්නන් අනුයුක්ත කිරීම පිළිබඳ විස්තර 11

2.2.1 **අනුමත කළ පුහුණු මධ්‍යස්ථාන** 12

2.3 ශිෂ්‍යයින් පුහුණු මධ්‍යස්ථානවලට වෙන් කිරීම සහ පුහුණුකරුවන්ගේ නම් 23

2.4 විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් අනුමත කිරීම් 24

2.4.1 **ආයුර්වේද විශේෂඥ වෛද්‍ය උපාධිය** 24

2.4.2 **සිද්ධ විශේෂඥ වෛද්‍ය උපාධිය** 24

2.4.3 **යුනානි විශේෂඥ වෛද්‍ය උපාධිය** 25

3. පරිපාලන අංශ 25

3.1 පරිපාලන අංශය 25

3.2 මූල්‍ය අංශය 26

4. මානව සම්පත් දත්ත 27

4.1 අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන කාර්ය මණ්ඩලය 27

5. 2020 දෙසැම්බර් මස 31වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය 29

6. විගණකාධිපති වාර්තාව 61

7. විගණකාධිපති වාර්තාවට පිළිතුර 65

8. තිරසර සංවර්ධනය සඳහා යෝජනාව 67

1. ආයතනය

1.1 *කෙටි හැඳින්වීම*

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ 2017 දෙසැම්බර් මස 08 වැනි දිනැති, අංක 2048/46 දරන දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය යටතේ කොළඹ විශ්වවිද්‍යාලයට අයත් ආයතනයක් ලෙස පිහිටුවා ඇති අධ්‍යාපන ආයතනයකි. ඒ අනුව එය සෞඛ්‍ය සේවා, විශ්වවිද්‍යාල සහ පෞද්ගලික අංශය සඳහා මානව සම්පත් අවශ්‍යතාවන් සපුරාලීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. සෞඛ්‍ය ව්‍යවස්ථා සංග්‍රහයට අනුව සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද, සිද්ධ සහ යුනානි යන ප්‍රධාන ක්ෂේත්‍රවල විශේෂඥ වෛද්‍යවරු සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ආයුර්වේද, යුනානි සහ සිද්ධ අධ්‍යාපනය සඳහා විශේෂඥයින් සැපයීම දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වගකීම වේ. ඒ අනුව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන දිවයිනට අවශ්‍ය කරන ශ්‍රම බල අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වන අධ්‍යයන පාඨමාලා ආරම්භ කිරීමට යෝග්‍ය පියවර ගෙන ඇත.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මෙහෙයුම් කටයුතු, 2019 පෙබරවාරි මස 25වැනි දින කළමනාකරණ මණ්ඩලයේ පළමුවැනි රැස්වීම පැවැත්වීමෙන් පසුව 2019 මාර්තු මාසයේ දී ආරම්භ කරන ලදී. ආයතනය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ලබා දෙන තෙක් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට අයත් බොරැල්ලේ පිහිටි ආයුර්වේද ශික්ෂණ රෝහල තුළ තාවකාලික පහසුකමක් ලෙස ස්ථාපනය කර ඇත.

ආයුර්වේද, සිද්ධි සහ යුනානි විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් ආරම්භ කිරීම සඳහා 2020 වර්ෂය තුළ දී කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන මණ්ඩලයේ, කළමනාකරණ මණ්ඩලයේ සහ සනාතන සභාවේ අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට පියවර ගෙන ඇත. ඒ අනුව 2020 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් උපාධි වැඩසටහන් දෙකක් අනුමත කර ඇති අතර උපාධි වැඩසටහන් හතරක් QAC සහ ස්ථාවර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අනුමත කර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

ඒ හා සමඟාමීව, ආයතනය සඳහා ගොඩනැගිලි නවීකරණය සහ යන්ත්‍රසූත්‍ර ප්‍රසම්පාදනය වැනි යටිතලපහසුකම් සංවර්ධනයට ද පියවර ආරම්භ කර ඇත. ආයතනයේ මානව සම්පත් ශක්තිමත් කිරීම පිණිස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් 2020 වර්ෂයේදී එක් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරියක් පත් කර ඇති අතර ආයතනය මඟින් කොළඹ විශ්වවිද්‍යාලයේ අනුමැතිය

ඇතිව, කළමනාකරණ සහකාරවරුන්ගේ සහ වැඩ සහායක නිලධාරීන්ගේ සේවය පැවරුම් පදනම මත දිර්ඝ කිරීමට කටයුතු කර ඇත. විශ්වවිද්‍යාලවල අනධ්‍යයන තනතුරු සඳහා පත්වීම් සීමා කරමින් රජය විසින් පනවා ඇති චක්‍රලේඛ හේතුවෙන් ආයතනයට 2020 වසරේ දී එහි අනධ්‍යයන සේවක සංඛ්‍යා සඳහා නව නිලධාරීන් බඳවා ගැනීමට නොහැකි වී ඇත.

ආයතනික ව්‍යුහය



ජේ.ස.ලේ. - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකඛාධිකාරි
ජේ.ස.මූ. - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි
ජා.ස.ස.ක.- ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වූ කමිටුව
වි.සං.ඇ.ක. - විෂයමාලා සංවර්ධන ඇගයීම් කමිටුව

1.2 *ආයතනයේ අධ්‍යක්ෂවරයා*

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා විද්‍යායතනයේ අධ්‍යක්ෂ වේ.

මහාචාර්ය ජයන්ත ජයවර්ධන මහතා (2020 ජනවාරි මස 01 සිට 2020 අප්‍රේල් මස 20 දක්වා) සහ මහාචාර්ය වසන්ත ගුණතුංග මහතා (2020 ජුනි මස 23 සිට 2020 ජනවාරි මස 31 දක්වා) 2020 වසරේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරු ලෙස සේවය කර ඇත.

1.3 *කළමනාකරණ මණ්ඩලය*

කළමනාකරණ මණ්ඩලය දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධාන විධායක සහ අධ්‍යයන මණ්ඩලය වන අතර සෑම මාසයකදීම එහි රැස්වීම් පවත්වනු ලැබේ. 2020 වර්ෂය තුළ දී කළමනාකරණ මණ්ඩලයේ (සාමාන්‍ය සහ විශේෂ) රැස්වීම් හයක් පවත්වන ලදී.රට තුළ පැවති covid 19 තත්වය හේතුවෙන් සෑම සමකම රැස්වීම් පැවැත්වීමට නොහැකි විය.

මණ්ඩලයේ රැස්වීම් සංඛ්‍යාව, දින සහ සහභාගිවීම් පිළිබඳ වාර්තා පහත දක්වා ඇත.

රැස්වීම් සංඛ්‍යාව	රැස්වීම් දිනය	සහභාගී වූ සංඛ්‍යාව	සහභාගී නොවීම සඳහා හේතු දැක් වූ සාමාජිකයින් සංඛ්‍යාව	සහභාගී නොවූ සංඛ්‍යාව
10 වැනි රැස්වීම (2020-01)	2020.02.28	15	01	02
11 වැනි රැස්වීම (2020-01)	2020.07.10	15	02	01
විශේෂ රැස්වීම	2020.08.11	15	01	02
12 වැනි රැස්වීම	2020.09.18	12	07	0
13 වැනි රැස්වීම	2020.11.06	10	01	08
14 වැනි රැස්වීම	2020.12.30	13	01	5

1වැනි වගුව

සමාලෝචිත වර්ෂය තුළ දී පහත දැක්වෙන සාමාජිකයින් කළමනාකරණ මණ්ඩලයට ඇතුළත් විය.

මහාචාර්ය ජයන්ත ජයවර්ධන මහතා	- අධ්‍යක්ෂ
මහාචාර්ය වසන්ත ගුණතුංග මහතා	- වැඩබලන අධ්‍යක්ෂ (2020 ජුනි 23 සිට)
එම්. එම්. ක්‍රිශාන්ති මෙය	- අධ්‍යක්ෂ - විදේශ අධ්‍යාපනය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
කුමාරි වීරසේකර මෙය	- ලේකම්/දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
ටී. එන්. ඔසන් මහතා	- අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
කේ. ඩී. සී. එස්. කුමාරතුංග මහතා	- ආයුර්වේද කොමසාරිස්
මහාචාර්ය පී. ඒ. පරනගම මහත්මිය	- අධ්‍යක්ෂ, IIM
මහාචාර්ය ජනිතා ලියනගේ මහත්මිය	- නිසි බලධාරී, GWAI
වෛද්‍ය තයාලිනි තිලීපන් මහත්මිය	- ප්‍රධානී, සිද්ධ වෛද්‍ය අංශය, යාපනය විශ්වවිද්‍යාලය
වෛද්‍ය එන්. වරනකුලේන්ද්‍රන් මහතා	- ප්‍රධානී, සිද්ධ වෛද්‍ය අංශය, ත්‍රිකුණාමලය මණ්ඩපය
වෛද්‍ය ස්වර්නා කලුතොටගේ මහත්මිය	- වැඩබලන අධ්‍යක්ෂ/ BMARI
වෛද්‍ය ටී. වීරරත්න මහතා	- විශේෂ ශ්‍රේණියේ වෛද්‍ය (ආයුර්වේද)
වෛද්‍ය වී. සෙල්වනාදන් මහත්මිය	- විශේෂ ශ්‍රේණියේ වෛද්‍ය (සිද්ධ)
වෛද්‍ය ඒ. ජී. එෆ්. නජීයා මහත්මිය	- විශේෂ ශ්‍රේණියේ වෛද්‍ය (යුනානි)
ටී. ධර්මරාජා මහතා	- වි.ප්‍ර.කො.ස. පත් කළ සාමාජික
එස්. ඩී. ඩබ්ලිව්. සමන් දියගහ වඩුගේ මහතා	- වි.ප්‍ර.කො.ස. පත් කළ සාමාජික
කේ. කේ. සමින්ද ප්‍රියංග කෝණාර මහතා	- වි.ප්‍ර.කො.ස. පත් කළ සාමාජික
මහාචාර්ය ජේ. බී. දිසානායක	- පාලක සභාව නම් කළ සාමාජික
මහින්ද මඩිහහේවා මහතා	- පාලක සභාව නම් කළ සාමාජික

1.4 *මූල්‍ය කමිටුව*

2020 වර්ෂය තුළ මූල්‍ය කමිටුව එක් වරක් සිය රැස්වීම් පවත්වන ලද අතර මූල්‍ය කමිටුවේ සියලුම සාමාජිකයින් එම රැස්වීමට සහභාගී වූහ.

2020 වසර තුළ දී මූල්‍ය කමිටුවට පහත දැක්වෙන සාමාජිකයින් ඇතුළත් විය.

මහාචාර්ය වසන්ත ගුණතුංග	- සභාපති, (2020 ජුනි 23 සිට ක්‍රියාත්මක වන පරිදි)
මහාචාර්ය පී. ඒ. පරනගම මහත්මිය	- අධ්‍යක්ෂ, IIM
ටී. ධර්මරාජා මහතා	- ව්.ප්‍ර.කො.ස. පත් කළ කළමනාකරණ
මණ්ඩල සාමාජික	
ටී. එන්. ඔසන් මහතා	- අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, \රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

1.5 *අධ්‍යයන මණ්ඩල*

අධ්‍යයන කටයුතු, පුහුණු වැඩසටහන් සහ විභාග කටයුතු පිළිබඳ තීරණ කළමනාකරණ මණ්ඩලයේ සහ සනාතන සභාවේ අනුමැතියට යටත්ව, අධ්‍යයන මණ්ඩල (BOS) සහ විශේෂඥ මණ්ඩල (SpB) මඟින් ගනු ලැබේ. අධ්‍යයන මණ්ඩල සහ විශේෂඥ මණ්ඩලවල සියලුම රැස්වීම් සෑම මාසයකටම වරක් පවත්වනු ලැබේ.

1.5.1 අධ්‍යයන මණ්ඩල

1.5.1.1 අධ්‍යයන මණ්ඩල ලැයිස්තුව

ආයුර්වේද අධ්‍යයන මණ්ඩලය
සිද්ධ අධ්‍යයන මණ්ඩලය
යුනානි අධ්‍යයන මණ්ඩලය

1.5.1.2 2020 වසරේ දී පවත්වන ලද අධ්‍යයන මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව

මණ්ඩලයේ නම	පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව
ආයුර්වේද	8
සිද්ධ	3
යුනානි	6

2වැනි වගුව

1.5.1.3 අධ්‍යයන මණ්ඩලවල සභාපති සහ ලේකම් ධුරයන් – 2020

අධ්‍යයන මණ්ඩලය	සභාපති	ලේකම්
ආයුර්වේද	වෛද්‍ය එස්. එම්. එස්. සමරකෝන් මයා	වෛද්‍ය ඩබ්ලිව්. ජේ. වික්‍රමාරච්චි මිය
සිද්ධ	වෛද්‍ය ඒ. ශ්‍රීධරන් මිය	වෛද්‍ය එස්. උෂකාන්තන් මයා
යුනානි	මහාචාර්ය බී. එම්. නජීබ් මයා	වෛද්‍ය ඒ. ඩබ්ලිව්. එස්. ෆවුසියා මිය

3වැනි වගුව

1.5.2 *විශේෂඥ මණ්ඩල*

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය තුළ ආයුර්වේද, සිද්ධ සහ යුනානි විෂයන් සඳහා විශේෂඥ මණ්ඩල 10ක් ඇත. 2021 වර්ෂයේ දී යුනානි පිළිබඳ තවත් විශේෂඥ මණ්ඩල දෙකක් ස්ථාපිත කිරීමට සහ සාමාජිකයින් පත් කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී.

1.5.2.1 විශේෂඥ මණ්ඩල ලැයිස්තුව

ආයුර්වේද

කෞමාරභෘතය පිළිබඳ විශේෂඥ මණ්ඩලය
කායචිකිත්සා පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ප්‍රසූතිතන්ත්‍ර හා ස්ත්‍රී රෝග පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ශල්‍යතන්ත්‍ර පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ස්වස්ථවෘත පිළිබඳ විශේෂඥ මණ්ඩලය
භයිසජ්‍ය කල්පන සහ රාසශාස්ත්‍ර පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ශාලක්‍ය තන්ත්‍ර පිළිබඳ විශේෂඥ මණ්ඩලය

සිද්ධ

ගුණපාඩම් පිළිබඳ විශේෂඥ මණ්ඩලය
මරුතුවම් පිළිබඳ විශේෂඥ මණ්ඩලය

යුනානි

මෞලිජිත් පිළිබඳ විශේෂඥ මණ්ඩලය

1.5.2.2 2020 වසරේ දී පවත්වන ලද විශේෂඥ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව

මණ්ඩලයේ නම	පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව
ආයුර්වේද	
කෞමාරභෘතය	7
කායචිකිත්සා	6
ප්‍රසූතිතන්ත්‍ර	7
ශල්‍යතන්ත්‍ර	4
ස්වස්ථවෘත්ත	8
භයිසජ්‍ය කල්පන සහ රාසශාස්ත්‍ර	3
ශාලක්‍ය	2
සිද්ධ	
ගුණපාදම්	3
මරුතුවම්	4
යුනානි	
මෞලිජිත්	6

4 වැනි වගුව

1.5.2.3 විශේෂඥ මණ්ඩලවල සභාපති සහ ලේකම් ධුරයන් – 2020

විශේෂඥ මණ්ඩලය	සභාපති	ලේකම්
ආයුර්වේද		
කෞමාරභෘතය	වෛද්‍ය අයි. ඒ. එම්. ලීනා මිය	වෛද්‍ය ඕ. ටී. එම්. ආර්. කේ. එස්. කලවාන මිය
කායචිකිත්සා	වෛද්‍ය එස්. එම්. එස්. සමරකෝන් මයා	වෛද්‍ය කේ. ජී. සී. දිසානායක මිය
ප්‍රසූතිතන්ත්‍ර සහ ස්ත්‍රී රෝග	වෛද්‍ය කේ. පී. කේ. ආර්. කරුනාගොඩ මිය	වෛද්‍ය වයි. ඒ. යූ. ඩී. කරුණාරත්න මිය
ශල්‍යතන්ත්‍ර	වෛද්‍ය එල්. පී. ඒ. කරුණාතිලක මයා වෛද්‍ය බී. එම්. එස්. අමරජීව මිය	වෛද්‍ය කේ. කේ. වී. එස්. පේෂලා මිය
ස්වස්ථවෘත්ත	වෛද්‍ය කේ. සී. පෙරේරා මිය	වෛද්‍ය ඩබ්ලිව්. එම්. එස්. එස්. කේ. කුලතුංග මිය
භයිසජ්‍ය කල්පන සහ රස ශාස්ත්‍ර	වෛද්‍ය එස්. කේ. එම්. කේ. හැරපත්දෙනිය මිය	වෛද්‍ය එම්. වී. ආර්. විජයන්තිමාලා මිය
ශාලක්‍යතන්ත්‍ර	වෛද්‍ය කේ. පී. පී. පිරිස් මිය	වෛද්‍ය බී. එම්. එස්. අමරජීව මිය
සිද්ධ		
ගුණපාදම්	වෛද්‍ය එන්. වර්ණකුලේන්ද්‍රන් මයා	වෛද්‍ය එන්. නිතියකුමාර් මයා
මරුතුවම්	වෛද්‍ය ටී. කුමුත්‍රාජන් මයා	වෛද්‍ය බී. උදයනන් මයා
යුනානි	මහාචාර්ය බී. එම්. නජීබ් මයා	වෛද්‍ය ඒ. ඩබ්ලිව්. එස්. ෆවුසියා මිය 2020.09.25 සිට වෛද්‍ය මනුහා මිය
මෞලිජිත්	වෛද්‍ය එම්. සී. එම්. මහීස් මයා	වෛද්‍ය එම්. එච්. එම්. හෆීල් මයා

5 වැනි වගුව

2. 2020 වර්ෂය තුළ අධ්‍යයන කටයුතු

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2020 වර්ෂයේ දී පශ්චාත් උපාධි පුහුණුව සඳහා සිය පළමුවැනි ශිෂ්‍ය කණ්ඩායම බඳවා ගැනීමට පියවර ගෙන ඇත.

2.1 *ශිෂ්‍යයින් ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තර*

2020 අගෝස්තු මස 17 වැනි දින පහත දැක්වෙන ආයුර්වේදය පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා ශිෂ්‍යයින් ලියාපදිංචි කිරීම සිදු කරන ලදී.

1. වෛද්‍ය විශාරද ආයුර්වේද කෞමාරභෘතය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
2. වෛද්‍ය විශාරද ආයුර්වේද කායචිකිත්සා සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
3. වෛද්‍ය විශාරද ආයුර්වේද ප්‍රසූතිතන්ත්‍ර සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
4. වෛද්‍ය විශාරද ආයුර්වේද ශල්‍ය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
5. වෛද්‍ය විශාරද ආයුර්වේද ස්වස්ථවෘත සහ අධ්‍යයන මණ්ඩල සහතිකය

ඉහත වැඩසටහන් සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍යයින් සංඛ්‍යාව පහත දැක්වේ.

අධ්‍යයන වැඩසටහන	පූර්ණ කාලීන/ අර්ධ කාලීන	ශිෂ්‍ය බඳවා ගැනීම (ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව) (2020 දෙසැම්බර් 31වැනි දිනට)			ශිෂ්‍ය බඳවා ගැනීම (පළමු වසර සඳහා ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව) (2020 දෙසැම්බර් 31වැනි දිනට)		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
වෛද්‍ය විශාරද ආයුර්වේද කෞමාරභෘතය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන	1	1	2*		1	1
වෛද්‍ය විශාරද ආයුර්වේද කායචිකිත්සා සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන	7	9	16**	6	8	14
වෛද්‍ය විශාරද ආයුර්වේද ප්‍රසූතිතන්ත්‍ර හා ස්ත්‍රී රෝග සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන		4	4***		2	2
වෛද්‍ය විශාරද ආයුර්වේද ශල්‍යතන්ත්‍ර සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන	1		1	1		1
වෛද්‍ය විශාරද ආයුර්වේද ස්වස්ථවෘත්ත සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන		4	4****		1	1
මුළු එකතුව		**8**	**15**	**27**	**7**	**12**	**19**

***6* වැනි වගුව**

*එක් පුහුණුවන්නෙකු මාස 06 කාලයක් සඳහා නිදහස් කර ඇත.

**1. එක් පුහුණුවන්නෙකු පළමු වසර සඳහා ලියාපදිංචි වී නොමැත.

2. එක් පුහුණුවන්නෙකු වසරක කාලයක් සඳහා නිදහස් කර ඇත.

***1. එක් පුහුණුවන්නෙකු පාඨමාලාව හැර දමා ගොස් ඇත.

2. එක් පුහුණුවන්නෙකු වසරක කාලයක් සඳහා නිදහස් කර ඇත.

****පුහුණුවන්නන් දෙදෙනෙකු මාස 6 කාලයක් සඳහා නිදහස් කර ඇත.

2.1.1 විශේෂඥ ක්ෂේත්‍ර අනුව ශිෂ්‍යයින් ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තර



1වැනි ප්‍රස්තාරය

2.1.2 **ස්ත්‍රී-පුරුෂභාවය අනුව ශිෂ්‍යයින් ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තර.**



2වැනි ප්‍රස්තාරය

2.2 පුහුණු මධ්‍යස්ථාන, පුහුණුකරුවන් සහ පුහුණුවන්නන් අනුයුක්ත කිරීම පිළිබඳ විස්තර

පුහුණුවන්නන් අනුයුක්ත කිරීම සඳහා අවශ්‍ය පුහුණු මධ්‍යස්ථාන සඳහා අනුමැතිය ලබා ගැනීමට පියවර ගෙන ඇත. කළමනාකරණ මණ්ඩලයේ, අධ්‍යයන මණ්ඩල සහ විශේෂඥ මණ්ඩලවල නිර්දේශය ඇතිව, කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මඟින් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පශ්චාත් උපාධි පුහුණුවන්නන් පහත දැක්වෙන පුහුණු මධ්‍යස්ථාන වෙත යොමු කිරීම අනුමත කර ඇත. තව ද අවශ්‍ය අවස්ථාවල දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පශ්චාත් උපාධි පුහුණු වැඩකටයුතු සඳහා අමාත්‍යාංශයේ විශේෂඥ වෛද්‍යවරු, අනෙකුත් කාර්ය මණ්ඩලය සහ අමාත්‍යාංශයේ ආයුර්වේද රෝහල් උපයෝජනය කිරීම සඳහා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන ඇත.

2.2.1 අනුමත කළ පුහුණු මධ්‍යස්ථාන

කෞමාරභෘතය පිළිබඳ ආයුර්වේදය විශේෂඥ වෛද්‍ය උපාධිය සහ මණ්ඩල සහතිකය

පුහුණු මධ්‍යස්ථානයේ නම		**පුහුණුකරුවන්**	**අභ්‍යාසලාභීන් සංඛ්‍යාව**
ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, පුහුණු ඒකකය, බොරැල්ල	**පුහුණුකරුවන්**	වෛද්‍ය අයි. ඒ. එම්. ලීනා මිය ***(ප්‍රධාන පුහුණුකරු)*** *ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (ගෞරව)(කොළඹ), විශේෂඥ වෛද්‍ය උපාධිය (ආයු) (ඉන්දියාව)* ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය IIM, කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය වෛද්‍ය ඕ. ටී. එම්. ආර්. කේ. එස්. බී. කලවාන මිය *ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (ගෞරව)(කොළඹ), විශේෂඥ වෛද්‍ය උපාධිය (ආයු) (ඉන්දියාව)*	▪ උපරිම ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **02** ▪ උපරිම ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **02**
	ගුරුවරුන්	වෛද්‍ය ඩබ්ලිව්. ඒ. එස්. එස්. වීරකෝන් මිය *ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (ගෞරව)(කොළඹ), දර්ශනපති (කොළඹ), ආචාර්ය උපාධිය (ජයවර්ධනපුර)* වෛද්‍ය එන්. දඩල්ලගේ මිය *ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (ගෞරව)(කොළඹ), දර්ශනපති (කොළඹ)*	

7වැනි වගුව

කායචිකිත්සා පිළිබඳ ආයුර්වේදය විශේෂඥ වෛද්‍ය උපාධිය සහ මණ්ඩල සහතිකය

පුහුණු මධ්‍යස්ථානයේ නම		පුහුණුකරුවන්	අභ්‍යාසලාභීන් සංඛ්‍යාව
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල	**පුහුණුකරුවන්**	වෛද්‍ය කේ. ජී. සී. දිසානායක මිය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විශේෂඥ වෛද්‍ය උපාධිය *(ආයු)*-**කායචිකිත්සා**	▪ උපරිම ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **01** ▪ එක් වසරකින් උපරිම ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **01**
මීගොඩ ප්‍රාදේශීය රෝහල	**පුහුණුකරුවන්**	වෛද්‍ය ජේ. ඒ. එස්. ජයකොඩි මයා ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විශේෂඥ වෛද්‍ය උපාධිය *(ආයු)*-කායචිකිත්සාව	▪ උපරිම ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **02** ▪ උපරිම ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **01**
***කුරුණෑගල* ප්‍රාදේශීය රෝහල**	**පුහුණුකරුවන්**	වෛද්‍ය එම්. පී. එස්. කේ. ආර්. මුතුගල මයා ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විශේෂඥ වෛද්‍ය උපාධිය ***(ආයු) (කායචිකිත්සා)***	▪ උපරිම ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **02** ▪ උපරිම ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **02**
පල්ලෙකැලේ ප්‍රාදේශීය රෝහල	**පුහුණුකරුවන්**	වෛද්‍ය ටී. ජී. පුංචිහේවා මිය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විශේෂඥ වෛද්‍ය උපාධිය *(ආයු)*-කායචිකිත්සා	▪ උපරිම ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **02** ▪ උපරිම ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **01**
ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල ***(විශ්වවිද්‍යාල පුහුණු ඒකකය)***	**පුහුණුකරුවන්**	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඊ. ආර්. එච්. එස්. එස්. එදිරිවීර මිය (ප්‍රධාන පුහුණුකරු) ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විශේෂඥ වෛද්‍ය උපාධිය *(ආයු)*කායචිකිත්සා දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, රාජගිරිය වෛද්‍ය එස්. එම්. එස්. සමරකෝන් මයා ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විශේෂඥ වෛද්‍ය උපාධිය *(ආයු)*කායචිකිත්සා, ආචාර්ය උපාධිය *(ආයු)* කායචිකිත්සා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, රාජගිරිය.	▪ උපරිම ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **04** ▪උපරිම ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **04**

		වෛද්‍ය ආර්. ඩී. එච්. කුලතුංග මිය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විශේෂඥ වෛද්‍ය උපාධිය *(ආයු)*කායචිකිත්සා, ආචාර්ය උපාධිය *(ආයු)* කායචිකිත්සා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, රාජගිරිය. වෛද්‍ය ඊ. ඩී. ටී. පී. ගුණරත්න මිය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විශේෂඥ වෛද්‍ය උපාධිය *(ආයු)*කායචිකිත්සා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, රාජගිරිය. වෛද්‍ය කේ. අයි. ඩබ්ලිව්. කේ. සෝමරත්න මයා ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විශේෂඥ වෛද්‍ය උපාධිය *(ආයු)*කායචිකිත්සාව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, රාජගිරිය. වෛද්‍ය ආර්. එච්. එස්. කේ. ද සිල්වා මිය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විශේෂඥ වෛද්‍ය උපාධිය *(ආයු)*කායචිකිත්සා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, රාජගිරිය. වෛද්‍ය එන්. ඩී. එන්. ජයවර්ධන මයා ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විශේෂඥ වෛද්‍ය උපාධිය *(ආයු)*කායචිකිත්සාව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, රාජගිරිය.	
	ගුරුවරුන්	වෛද්‍ය එන්. වී. පී. රෝහිනී මිය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, දර්ශනපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, රාජගිරිය. වෛද්‍ය කේ. ආර්. වීරසේකර මිය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, දර්ශනපති, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, රාජගිරිය වෛද්‍ය **ඒ. ජී. සමරවික්‍රම මිය** ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, දර්ශනපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, රාජගිරිය. වෛද්‍ය එච්. ජී. එස්. පී. හේවාගීගන මිය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, දර්ශනපති	

		ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, රාජගිරිය.	
ආයුර්වේද පුහුණු ඒකක දෙපාර්තමේන්තුව	**පුහුණුකරුවන්**	වෛද්‍ය නයනා ලියනගේ මිය විශේෂඥ වෛද්‍ය උපාධිය *(ආයු)*-කායචිකිත්සා ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල, කොළඹ-08 (ප්‍රධාන පුහුණුකරු)	▪ උපරිම ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **01** ▪ උපරිම ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **01**
	ගුරුවරුන්	වෛද්‍ය සුධර්මා කොඩිතුවක්කු මිය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විශේෂඥ වෛද්‍ය උපාධිය *(ආයු)*-කායචිකිත්සා ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල, කොළඹ-08.	

8 **වැනි වගුව**

ප්‍රසූතිතන්ත්‍රය සහ ස්ත්‍රීරෝග පිළිබඳ ආයුර්වේදය විශේෂඥ වෛද්‍ය උපාධිය සහ මණ්ඩල සහතිකය

පුහුණු මධ්‍යස්ථානයේ නම		**පුහුණුකරුවන්**	**අභ්‍යාසලාභීන් සංඛ්‍යාව**
ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල, (විශ්වවිද්‍යාල පුහුණු ඒකකය)	**පුහුණුකරුවන්**	වෛද්‍ය එස්. ඒ. ඩී. සිරිවර්ධන මිය *(ප්‍රධාන පුහුණුකරු)* ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය *(ගෞරව)(කොළඹ),* විශේෂඥ වෛද්‍ය උපාධිය *(ආයු) (ඉන්දියාව),* ආචාර්ය උපාධිය *(ආයු)* ස්ත්‍රීරෝග ප්‍රසූතිතන්ත්‍ර වෛද්‍ය කේ. පී. කේ. ආර්. කරුණාගොඩ මිය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය *(ගෞරව)(කොළඹ),*විද්‍යාපති *(ආයු) (ඉන්දියාව),*ස්ත්‍රීරෝග ප්‍රසූතිතන්ත්‍ර වෛද්‍ය වයි. ඒ. යූ. ඩී. කරුණාරත්න මිය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය *(ගෞරව)(කොළඹ),*විද්‍යාපති *(ආයු) (ඉන්දියාව),* ස්ත්‍රීරෝග ප්‍රසූතිතන්ත්‍ර	▪ උපරිම ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **02** ▪ උපරිම ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **01**

බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණ ආයතනය	පුහුණුකරුවන්	වෛද්‍ය එච්. එල්. එම්. ජී. සජීවනී මිය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය *(ගෞරව)(කොළඹ),*විද්‍යාපති *(ආයු) (ඉන්දියාව),* ස්ත්‍රීරෝග ප්‍රසූතිතන්ත්‍ර	▪ උපරිම ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **01** ▪ උපරිම ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **01**
පල්ලෙකැලේ ප්‍රාදේශීය රෝහල	පුහුණුකරුවන්	වෛද්‍ය කේ. එම්. එම්. කඩුදුන්කෝරාල මිය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය *(කොළඹ),*විද්‍යාපති *(ආයු)(ඉන්දියාව)* ස්ත්‍රීරෝග ප්‍රසූතිතන්ත්‍ර	▪ උපරිම ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **01** ▪ උපරිම ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **01**

***9*වැනි වගුව**

ආයුර්වේද ශල්‍ය තන්ත්‍රය පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධිය සහ මණ්ඩල සහතිකය

පුහුණු මධ්‍යස්ථානයේ නම		**පුහුණුකරුවන්**	**අභ්‍යාසලාභීන් සංඛ්‍යාව**
ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල, පුහුණු ඒකකය	පුහුණුකරුවන්	වෛද්‍ය එල්. පී. ඒ. කරුණාතිලක මයා *(ප්‍රධාන පුහුණුකරු)* ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විශේෂඥ වෛද්‍ය උපාධිය *(ආයු)*ශල්‍ය සාමාන්‍ය *(BHU),* ආචාර්ය උපාධිය *(ගුජරාට්)*ඉන්දියාව වෛද්‍ය **ඒ. කේත එස්. වීරසේකර මිය** ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විද්‍යාපති *(ආයු)*ඉන්දියාව	▪ උපරිම ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **01** ▪ උපරිම ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **01**

	සහකාර කථිකාචාර්යවරුන්	වෛද්‍ය ඩී. ආර්. ඒ. සකුන්තලා මිය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විද්‍යාපති *(ශල්‍ය - සග්නාහරන)(BHU)* වෛද්‍ය බී. එම්. එස්. අමරජීව මිය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විද්‍යාපති ආයු*(ශල්‍ය සාමාන්‍ය)(BHU)* වෛද්‍ය කේ. කේ. වී. එස්. පේෂලා මිය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විශේෂඥ වෛද්‍ය උපාධිය *(ආයු)(ශල්‍ය සාමාන්‍ය) (BHU)* වෛද්‍ය **කේ. ඩී. ලොකුගමගේ මයා** ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විද්‍යාපති *(ආයු)(ශල්‍ය)(BHU)*	
බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණ ආයතනය	**සහකාර කථිකාචාර්යවරුන්**	වෛද්‍ය ඒ. එස්. අජ්මීර් මයා ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විද්‍යාපති *(ආයු)* ශල්‍ය තන්ත්‍ර *IPGT* සහ *RA* ඉන්දියාව	▪ උපරිම ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **01** ▪ උපරිම ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **01**
ගම්පහ චික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල	**සහකාර කථිකාචාර්යවරුන්**	වෛද්‍ය ඒ. ඒ. ජේ. පුෂ්පකුමාර මයා *(ප්‍රධාන පුහුණුකරු)* විද්‍යාපති *(ආයු)(BHU)* ඉන්දියාව වෛද්‍ය **කේ. සී. පී. ගුණරත්න** විද්‍යාපති *(ආයු)(ශල්‍ය)(ඉන්දියාව)*	▪ උපරිම ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **01** ▪ උපරිම ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරීවරු සංඛ්‍යාව: **01**

***10* වැනි වගුව**

ආයුර්වේද ස්වස්ථවෘත්ත පිළිබඳ ආයුර්වේදය විශේෂඥ වෛද්‍ය උපාධිය සහ මණ්ඩල සහතිකය

පුහුණු මධ්‍යස්ථානයේ නම		පුහුණුකරුවන්	අභ්‍යාසලාභීන් සංඛ්‍යාව	වෙනත්
අ. ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල, (විශ්වවිද්‍යාල පුහුණු ඒකකය)	පුහුණුකරුවන්	වෛද්‍ය කේ. සී. පෙරේරා මිය *(ප්‍රධාන පුහුණුකරු)* ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විශේෂඥ වෛද්‍ය උපාධිය *(ආයු)* ස්වස්ත්‍රවෘත්ත සහ යෝග ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, රාජගිරිය වෛද්‍ය ඩබ්ලිව්. එම්. එස්. එස්. කේ. කුලතුංග මිය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විශේෂඥ වෛද්‍ය උපාධිය *(ආයු)* ස්වස්ත්‍රවෘත්ත සහ යෝග ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I ශ්‍රේණිය දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, රාජගිරිය		▪සතියකට ඇති සාමාන්‍ය සායන සංඛ්‍යාව : 05 සායනයකට ඇති මුළු සායනික සහභගිවීම් සංඛ්‍යාව: 50 ▪සතියකට ඇති විශේෂ සායන සංඛ්‍යාව සහ නම්: 03 යෝග සායනය - සායනයකට ඇති මුළු සායනික සහභගිවීම් සංඛ්‍යාව: 30-40 ▪බාහිර රෝගී අංශයේ දෛනික රෝගීන් පැමිණීමේ

	ගුරුවරුන්	වෛද්‍ය ටී. ඩී. එන්. කරුණාරත්න මිය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, දර්ශනපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, රාජගිරිය වෛද්‍ය කේ. එච්. ඒ. එස්. ජයසිංහ මිය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, දර්ශනපති ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල, කොළඹ -08.		සාමාන්‍ය: 700-800 (මුළු OPD රෝගීන්/දිනය)
ආ. බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනය, නාවින්න	ගුරුවරුන්	වෛද්‍ය එම්. ආර්. එස්. පිරිස් මිය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, විශේෂඥ වෛද්‍ය උපාධිය *(ආයු)* පංචකර්ම බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනය, නාවින්න		▪සතියකට ඇති විශේෂ සායන සංඛ්‍යාව සහ නම්: 01 (පංචකර්ම සායනය) ▪ සායනයකට ඇති මුළු සායනික සහභගිවීම් සංඛ්‍යාව: 10-15 ▪ බාහිර රෝගී අංශයේ දෛනික රෝගීන් පැමිණීමේ සාමාන්‍ය: 500-600 ▪ ඇඳන් සංඛ්‍යාව: 08 සතියකට සිටින රෝගීන් සංඛ්‍යාව: 02 මාසයක් තුළ ඇඳන් භාවිතා කිරීමේ සාමාන්‍ය අනුපාතය: 90% දවසකට ඇතුළත් කරන නව රෝගීන් සංඛ්‍යාව: 1-2

ඇ. දේශීය වෛද්‍ය විද්‍යා ජාතික ආයතනය, නාවින්න	ගුරුබරුන්	**අධ්‍යක්ෂ** කාර්ය භාර නිලධාරී ජ්‍යෙෂ්ඨ ආයුර්වේද වෛද්‍ය නිලධාරී ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය		▪දේශන ශාලා සංඛ්‍යාව: 02 ▪මාසයකට පවත්වන පුහුණු වැඩසටහන් සංඛ්‍යාව: 05-10 ▪එක් අවස්ථාවක් සඳහා සහභාගීවන්නන්ගේ සංඛ්‍යාව: 40-100 ▪පුහුණු ඒකකයේ ඇති කුඩා පුස්තකාලය: 01 ▪සාකච්ඡා කාමරයක් තිබීම: ඔව්
ඇ. ආයුර්වේද රෝහල, ගාල්ල	ගුරුබරුන්	වෛද්‍ය කේ. ඒ. එම්. ජී. නානායක්කාර මයා ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය, දර්ශනපති දිසානායක ආයුර්වේද රෝහල, ගාල්ල		▪සතියකට ඇති විශේෂ සායන සංඛ්‍යාව සහ නම්: 01 (මධුමේහ සායනය) ▪ සායනයකට ඇති මුළු සායනික සහභාගිවීම් සංඛ්‍යාව: 45-50 ▪ බාහිර රෝගී අංශයේ දෛනික රෝගීන් පැමිණීමේ සාමාන්‍ය: 400-500

ඉ. තෝරාගත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාස - මහරගම, කෝට්ටේ සහ තිඹිරිගස්යාය	ඉරුබරුන්	තෝරා ගත් ප්‍රදේශවල ආයුර්වේද ප්‍රජා වෛද්‍ය නිලධාරී කොට්ඨාස ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය		▪සතියකට ඇති පාසැල් සෞඛ්‍ය වැඩසටහන් සංඛ්‍යාව: 01 මාසයකට ඇති පාසැල් සෞඛ්‍ය වැඩසටහන් සංඛ්‍යාව: 4-5 එක් අවස්ථාවකට සහභාගී වන ශිෂ්‍යයින් සංඛ්‍යාව: 100-200 ස්ථානය: පාසැල් ශ්‍රවණාගාරය ▪මාසයකට ඇති පෙර පාසැල් සෞඛ්‍ය වැඩසටහන් සංඛ්‍යාව: 02 එක් අවස්ථාවකට සහභාගී වන ශිෂ්‍යයින් සංඛ්‍යාව: 20-30 ස්ථානය: අදාළ පෙර පාසැල ▪මාසයකට පවත්වන ප්‍රජා පාදක වැඩිහිටි සෞඛ්‍ය වැඩසටහන් සංඛ්‍යාව: 02 එක් අවස්ථාවකට සහභාගී වන පුද්ගලයින් සංඛ්‍යාව: 25-30 ▪මාසයකට පවත්වන ප්‍රජා පාදක කාන්තා සෞඛ්‍ය වැඩසටහන් සංඛ්‍යාව: 02 එක් අවස්ථාවකට සහභාගී වන සංඛ්‍යාව: 25-30 එක් මාසයකට සහභාගීවන්නන් සංඛ්‍යාව: 80-100 ▪මාසයකට පවත් වන ප්‍රජා පාදක මත්ද්‍රව්‍ය අපයෝජනය කළමනාකරණ වැඩසටහන් සංඛ්‍යාව: 01 එක් වැඩසටහනකට සහභාගීවන්නන් සංඛ්‍යාව: 40-50 ▪මාසයකට පවත්වන ජංගම සායන: 03 ස්ථානය (තෝරා ගත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

				කොට්ඨාසවල ඇති ප්‍රජා ශාලා/ පන්සල්) එක් සායනයකට සහභාගී වන මුළු සංඛ්‍යාව: 40-50 මාසයකට සහභාගී වන මුළු සංඛ්‍යාව: 125-150
ඊ. කොළඹ මහ නගරසභාවේ සායන	ශ්‍රේණිගත	වෛද්‍ය රුවන් විජයමුණි මයා විශේෂඥ වෛද්‍ය උපාධිය, *MCH* විද්‍යාපති ප්‍රජා වෛද්‍ය විද්‍යාව, ප්‍රධාන වෛද්‍ය නිලධාරී, කොළඹ මහ නගරසභාව ඒකකයේ අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල MOIC	▪එක් එක් වසර සඳහා බඳවා ගැනීමට නියමිත උපරිම ලේඛකාධිකාරවරු සංඛ්‍යාව - 03 ▪ එක් එක් වසර සඳහා බඳවා ගැනීමට නියමිත උපරිම ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරවරු සංඛ්‍යාව - 03	▪කොළඹ මහනගරසභා කොට්ඨාසය තුළ ඇති සායන සංඛ්‍යාව: 14 ▪සතියකට ඇති සායන සංඛ්‍යාව: 05 ▪දිනකට සායනයකට පැමිණෙන මුළු සංඛ්‍යාව: 100-200 ▪මාසයකට සායනයකට පැමිණෙන සංඛ්‍යාව: 2500-3500
උ. ජල පවිත්‍රකාගාර මධ්‍යස්ථාන - ලබුගම, කලටුවාව සහ අඹතලේ		මධ්‍යස්ථානයේ කාර්ය භාර නිලධාරී ඉංජිනේරු විද්‍යාවේදී ඉංජිනේරු		▪ජල පවිත්‍රකාගාර ඒකක: 03 ▪ශ්‍රව්‍ය දෘශ්‍ය පහසුකම් ඇති දේශනශාලා: 01 ▪ජල නියැදි පරීක්ෂා කිරීම සඳහා විද්‍යාගාර තිබීම: ඔව් ▪සාකච්ඡා කාමර තිබීම: ඔව්
ඌ. සත්වඝාතකාගාර -දෙමටගොඩ		කාර්ය භාර නිලධාරී පශු ශල්‍ය වෛද්‍ය, පශුවෛද්‍ය විද්‍යා උපාධිය		▪ ශ්‍රව්‍ය දෘශ්‍ය පහසුකම් ඇති දේශනශාලා තිබීම: ඔව් ▪මස් පරීක්ෂා කිරීමේ පහසුකම් තිබීම (හරක් මස්, එළු මස්, ඌරු මස්, කුකුළු මස්): ඔව් (දිනකට ඝාතනය කරන සංඛ්‍යාව - ගවයින් 10-12, එළුවන් 10-15, ඌරන් 4-5)

11 **වැනි වගුව**

2.3 *ශිෂ්‍යයින් පුහුණු මධ්‍යස්ථානවලට වෙන් කිරීම සහ පුහුණුකරුවන්ගේ නම්*

අංකය	පුහුණුවන්නාගේ නම	විශේෂඥතාව	පුහුණු මධ්‍යස්ථානය	පුහුණුකරුගේ නම
1	වෛද්‍ය ජේ. ඒ. නිරෝෂා මිය	කෞමාරභෘත්‍යය	ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල	වෛද්‍ය අයි. ඒ. එම්. ලීනා මිය
2	වෛද්‍ය ජේ. සී. ජයකොඩි මිය	කායචිකිත්සා	ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඊ. ආර්. එච්. එස්. එස්. එදිරිවීර
3	වෛද්‍ය බී. ජී. එම්. කේ. රාජකරුණා මිය	කායචිකිත්සා	ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල	වෛද්‍ය නයනා ලියනගේ මිය (ඉල්ලා අස්විය)
4	වෛද්‍ය ඩී. එන්. ඩී. පී. සමරමාදු මිය	කායචිකිත්සා	මීගොඩ ප්‍රාදේශීය රෝහල	වෛද්‍ය ජේ. ඒ. එස්. ජයකොඩි
5	වෛද්‍ය ආර්. ජේ. වැලිකල මිය	කායචිකිත්සා	මීගොඩ ප්‍රාදේශීය රෝහල	වෛද්‍ය ජේ. ඒ. එස්. ජයකොඩි
6	වෛද්‍ය එම්. අයි. ජේ. ජයකොඩි මිය	කායචිකිත්සා	ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල	වෛද්‍ය ආර්. එච්. එස්. කේ. ද සිල්වා මිය
7	වෛද්‍ය කේ. පී. ඩී. සී. පෙරේරා මිය	කායචිකිත්සා	ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල	වෛද්‍ය ආර්. ඩී. එච්. කුලතුංග
8	වෛද්‍ය කේ. කේ. අයි. එරංග මයා	කායචිකිත්සා	ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල	වෛද්‍ය කේ. ජී. සී. දිසානායක මිය
9	වෛද්‍ය එස්. කේ. පී. වෛද්‍යරත්න මිය	කායචිකිත්සා	ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල	වෛද්‍ය එස්. එම්. එස්. සමරකෝන්
10	වෛද්‍ය ඩබ්ලිව්. කේ. ජයරත්න මිය	කායචිකිත්සා	ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල	වෛද්‍ය එන්. ඩී. එන්. ජයවර්ධන
11	වෛද්‍ය කේ. ඒ. එල්. එස්. කුරුප්පු ආරච්චි මයා	කායචිකිත්සා	ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල	වෛද්‍ය කේ. අයි. ඩබ්ලිව්. කේ. සෝමරත්න
12	වෛද්‍ය වයි. ඩී. එස්. එස්. සුරවීර මයා	කායචිකිත්සා	ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල	වෛද්‍ය ඊ. ඩී. ටී. පී. ගුණරත්න මිය
13	වෛද්‍ය පී. ආර්. ධර්මරත්න මයා	කායචිකිත්සා	කුරුණෑගල ආයුර්වේද රෝහල	වෛද්‍ය එම්. මුතුගල (ඉල්ලා අස්විය)
14	වෛද්‍ය කේ. එච්. එම්. එස්. පී. කේ. කස්තුරිසිංහ මයා	කායචිකිත්සා	කුරුණෑගල ආයුර්වේද රෝහල	වෛද්‍ය එම්. මුතුගල (ඉල්ලා අස්විය)
15	වෛද්‍ය ඒ. එම්. එම්. පරණගම මිය	කායචිකිත්සා	ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල	වෛද්‍ය එස්. කොඩිතුවක්කු
16	වෛද්‍ය එස්. එම්. ඩී. එන්. පී. සේනාරත්න මිය	ප්‍රසූතිතන්ත්‍ර	ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල	වෛද්‍ය වයි. ඒ. යූ. ඩී. කරුණාරත්න මිය
17	වෛද්‍ය පී. ජී. පී. එන්. විජයවික්‍රම මිය		ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල	වෛද්‍ය කේ. පී. කේ. ආර්. කරුණාගොඩ මිය
18	වෛද්‍ය ආර්ත එන්. ඩී. පතිරන මයා		ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල	වෛද්‍ය බී. එම්. එස්. අමරජීව මිය
19	වෛද්‍ය එස්. ජී. පූංචිහේවා මිය		ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල	වෛද්‍ය ඩබ්ලිව්. එම්. එස්. එස්. කේ. කුලතුංග මිය

***12* වැනි වගුව**

2.4 *විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් අනුමත කිරීම්*

සමාලෝචිත වර්ෂය තුළ දී ආයුර්වේද, සිද්ධ සහ යුනානි පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් සකස් කිරීම, අදාළ බලධාරීන්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම යනාදී කටයුතු ඉටු කරන ලදී. ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ, සියලුම අධ්‍යයන මණ්ඩලවල සහ විශේෂඥ මණ්ඩලවල සභාපතිවරුන්ගේ දැඩි කැපවීම තුළින් මෙම වැඩ කටයුතු සම්පූර්ණ කරන ලදී. 2020 වර්ෂයේ දී අදාළ බලධාරීන් විසින් අනුමත කළ පාඨමාලා පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

2.4.1 **ආයුර්වේද විශේෂඥ වෛද්‍ය උපාධිය**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෛද්‍ය විශාරද ආයුර්වේද කෞමාරභෘතය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය සහ වෛද්‍ය විශාරද ආයුර්වේද කායචිකිත්සා සහ අධ්‍යයන මණ්ඩල සහතිකය සඳහා අනුමැතිය ලබා දී ඇත. මෙයට අමතරව, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් වෛද්‍ය විශාරද ආයුර්වේද ප්‍රසූතිතන්ත්‍ර සහ අධ්‍යයන මණ්ඩල සහතිකය, වෛද්‍ය විශාරද ආයුර්වේද ශල්‍යතන්ත්‍ර සහ අධ්‍යයන මණ්ඩල සහතිකය සහ වෛද්‍ය විශාරද ආයුර්වේද ස්වස්ථවෘත සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
සඳහා අයදුම්පත්‍ර භාර දී ඇත.

ඉහත නිර්දේශයන්ට අමතරව, පහත දැක්වෙන ආයුර්වේද විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් සඳහා දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සහ සෙනෙට් සභාවේ නිර්දේශ ලබා ගන්නා ලදී.

i. වෛද්‍ය විශාරද ආයුර්වේද භයිසජ්‍ය කල්පන සහ රාසශාස්ත්‍ර සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
ii. වෛද්‍ය විශාරද ආයුර්වේද ශාලක්‍ය තන්ත්‍ර සහ අධ්‍යයන මණ්ඩල සහතිකය

2.4.2 **සිද්ධ විශේෂඥ වෛද්‍ය උපාධිය**

පහත දැක්වෙන සිද්ධ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් සඳහා දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සෙනෙට් සභාවේ නිර්දේශ ඇතිව අනුමැතිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

i. වෛද්‍ය විශාරද සිද්ධ ගුණපාදම් සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
ii. වෛද්‍ය විශාරද සිද්ධ මරුතුවම් සහ අධ්‍යයන මණ්ඩල සහතිකය

2.4.3 යුනානි විශේෂඥ වෛද්‍ය උපාධිය

වෛද්‍ය විශාරද යුනානි මෞලිජාත් සහ අධ්‍යයන මණ්ඩල සහතිකය පිළිබඳ අයදුම්පත්‍රය දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සෙනෙට් සභාවේ නිර්දේශ ඇතිව, අනුමැතිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

තව ද, පහත දැක්වෙන යුනානි පිළිබඳ ආයුර්වේද විශේෂඥ වෛද්‍ය උපාධි දෙක සඳහා දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සෙනෙට් සභාවේ නිර්දේශ ලබා ගෙන ඇත.

1. වෛද්‍ය විශාරද යුනානි ඉලිමුල් ඇඩ්වියා සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
2. වෛද්‍ය විශාරද යුනානි අම්රාස්-ඉ-නිස්වාන් සහ අධ්‍යයන මණ්ඩල සහතිකය

3. පරිපාලන අංශ

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පරිපාලන කටයුතු ප්‍රධාන වශයෙන් ආයතනයේ පරිපාලන අංශය සහ මූල්‍ය අංශය මඟින් සිදු කරනු ලැබේ.

3.1 *පරිපාලන අංශය*

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පරිපාලන අංශය මඟින් සියලුම සාමාන්‍ය පරිපාලන කටයුතු සහ අධ්‍යයන කටයුතුවලට සම්බන්ධ ක්‍රියාකාරකම් පවත්වාගෙන යනු ලැබේ. කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම සඳහා පරිපාලන සහයෝගය ලබාදීම, කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සහ පාලක සභාවේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ලේඛන ඉදිරිපත් කිරීම, අධ්‍යයන වැඩසටහන් සහ ශිෂ්‍ය අවශ්‍යතා සම්බන්ධ ලේඛන පිළිබඳව අදාළ බලධාරීන් සමඟ කටයුතු කිරීම ආදිය සමාලෝචිත වර්ෂය තුළ දී පරිපාලන අංශය මඟින් ඉටු කරනු ලබන ක්‍රියාකාරකම් විය.

මෙයට අමතරව, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ පෞද්ගලික ලිපි ගොනු කළමනාකරණය, අළුත්වැඩියා කටයුතු, ගොඩනැගිලි හා උපකරණ නඩත්තුව, කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයින් සඳහා පොදු සේවාවන් සැපයීම, සේවා ප්‍රසම්පාදනය හා සන්නිවේදන පහසුකම් සැපයීම සහ ප්‍රවාහන සේවාවන් සැපයීම පරිපාලන අංශය මඟින් ඉටු කරන පරිපාලන කටයුතු අතර වේ. 2020 වසරේ දී ස්ථිර පදනම මත පත් කළ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී මෙම වසරේ දී පරිපාලන අංශයේ ප්‍රධානී ලෙස කටයුතු කළ අතර වැඩපැවරීමේ පදනම මත පත්කළ එක් කළමනාකරණ සහකාරවරයෙක් සහ වැඩ සහායක වරයෙක් අංශයේ කාර්යයන් ඉටු කිරීමට සහාය විය.

3.2 *මූල්‍ය අංශය*

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය අංශය මූල්‍ය පරිපාලනය සහ අයිතම ප්‍රසම්පාදනය, වාර්ෂික, කාර්තුමය හා මාසික අයවැය සකස් කිරීම, මූල්‍ය කටයුතු පිළිබඳ වාර්තා අදාළ බලධාරීන්ට යැවීම, ආයතනය මඟින් ලබා ගන්නා සියලුම සේවා සඳහා ගෙවීම් සිදු කිරීම, සුළු මුදල් කළමනාකරණය, චෙක්පත් නිකුත් කිරීම, වැටුප් ගෙවීම ආදී කටයුතු රාශියක් ඉටු කරනු ලබයි.

මෙයට අමතරව, සියලුම පුනරාවර්තන හා ප්‍රාග්ධන අයිතම, ද්‍රව්‍ය, පොත්, වාරසඟරා ආදිය ප්‍රසම්පාදනය ආදිය දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය අංශය මඟින් කළමනාකරණය කරනු ලැබේ. ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරියක් මෙම අංශයේ ප්‍රධානී ලෙස කටයුතු කළ අතර එක් කළමනාකරණ සහකාර වරයෙක් සහ වැඩ සහායක වරයෙක් අංශයේ කටයුතු ඉටු කිරීමට සහාය විය.

4. මානව සම්පත් දත්ත

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කළ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම 2020 වසරේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මුහුණ දුන් ප්‍රධාන අභියෝගයක් විය. කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා අවස්ථා කිහිපයක දී පියවර ගනු ලැබුව ද 2020 වර්ෂය තුළ දී රජය නිකුත් කළ චක්‍රලේඛ හේතුවෙන් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට එහි සේවක සංඛ්‍යාව සම්පූර්ණ කිරීමට හැකියාවක් නොලැබුනි. කෙසේවුව ද, දෙසැම්බර් මාසයේ දී කළමනාකරණ සහකාර (III ශ්‍රේණිය) සඳහා සුදුසු තැනැත්තන් බඳවා ගැනීම පිණිස දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් තෝරා ගැනීමේ පරීක්ෂණයක් සහ තෝරා ගැනීමේ සම්මුඛ සාකච්ඡාවක් පවත් වන ලදී. ඒ අනුව කළමනාකරණ සහකාර නිලධරයින් තිදෙනෙක් එම තනතුරුවල රාජකාරී භාරගන්නා ලදී. කෙසේවුව ද, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන සහ පරිපාලන වැඩකටයුතුවල සාර්ථකත්වය සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම අභියෝගයක් වී ඇත.

4.1 *අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන කාර්ය මණ්ඩලය*

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව නිලධරයන් 16 දෙනෙක් වන අතර 2020.12.31 වැනි දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තරය පහත දැක්වෙන පරිදි වේ:

2020 දෙසැම්බර් මස 31වැනි දිනට අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන කාර්ය මණ්ඩලය - මුළු කාර්ය මණ්ඩලය

තනතුර	සේවය	ශ්‍රේණිය	වැටුප් කේතය	සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	වර්තමාන කාර්ය මණ්ඩලය	පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යක්ෂක	අධ්‍යයන		U-AC 5	ජ්‍යෙෂ්ඨ	1	*1	0
සහකාර පුස්තකාලයාධිපති	අධ්‍යයන		U-AC 3	ජ්‍යෙෂ්ඨ	1	0	1

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	UA&FS	II/I	U-EX 2	ජ්‍යෙෂ්ඨ	1	1	0
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී	UA&FS	II/I	U-EX 2	ජ්‍යෙෂ්ඨ	1	1	0
තාක්ෂණික නිලධාරී	UTS	III/II/I	U-MT 1	ද්විතියික	1	0	1
කළමනාකාර සහකාර	UMAS	III/II/I	U - MN 1	ද්විතියික	5	**2	3
කළමනාකාර සහකාර (පොත් තැබීම)	UMAS	III/II/I	U - MN 1	ද්විතියික	1	0	1
රියදුරු	UDS	III/II/I/Spl	U - PL 3	ප්‍රාථමික	3	0	3
වැඩ සහයක	UWAS	III/II/I/Spl	U - PL 1	ප්‍රාථමික	2	**1	1
එකතුව					**16**	**6**	**10**

*වැඩ බැලීමේ පදනම මත

**වැඩ පැවරීම් පදනම මත

***13* වැනි වගුව**

5. 2020 දෙසැම්බර් මස 31වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

දෙසැම්බර් මස 31වැනි දිනට	සටහන් අංකය	2020 රු.	2019 Rs.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	**3**	14,024,586	11,422,717
ස්ථිර තැම්පතුවල ආයෝජනය	**4**	1,500,000	-
කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම්	**5**	155,400	80,000
ලැබිය යුතු පොලී ආදායම		4,283	-
භාණ්ඩ ලේඛන/ තොග	**6**	95,635	117,133
මුළු ජංගම වත්කම්		15,779,903	11,619,850
ජංගම නොවන වත්කම්			
කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම්	**5**	331,667	260,000
දේපළ, පිරියත හා උපකරණ (ශුද්ධ)	**7**	5,629,510	5,739,339
මුළු ජංගම නොවන වත්කම්		5,961,176	5,999,339
මුළු වත්කම්		**21,741,079**	**17,619,189**

වගකීම්

ජංගම වගකීම්			
උපචිත වියදම්	**8**	2,878,956	1,689,383
ගෙවිය යුතු දේ	**9**	930,670	1,316,962
විලම්භිත ආදායම		1,341,667	-
මුළු ජංගම වගකීම්		5,151,292	3,006,345
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම්	**10**	1,369,603	438,776
මුළු ජංගම නොවන වගකීම්		1,369,603	438,776
මුළු වගකීම්		**6,520,895**	**3,445,120**
මුළු ශුද්ධ වත්කම්		**15,220,184**	**14,174,068**

ශුද්ධ වත්කම්/ සමකොටස්

වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන	**11**	3,469,477	2,718,626
වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන	**11**	2,422,248	3,142,594
MOHEවලින් ප්‍රාග්ධන ප්‍රදාන	**11**	8,403,288	8,759,378
සමුච්චිත අතිරික්තය/(හිඟය)	**12**	925,170	(446,530)
මුළු ශුද්ධ වත්කම්/ සමකොටස්		**15,220,184**	**14,174,068**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය නිකුත් කර ඇති රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව සකස් කර, ඉදිරිපත් කර ඇත.

.....	.....
සී.පී. හතරසිංහ	ඩබ්ලිව්.එන්.පී.එම්.එන්.එන්. කරුණාරත්න
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් වගකිව යුතුය.

මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය මඟින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

.....
මහාචාර්ය ක්‍රිශාන්ත අබේසේන
අධ්‍යක්ෂ

.....	.....
ටී. ධර්මරාජා	ටී. එන්. ඔසෙන්
කළමනාකරණ මණ්ඩලයේ සාමාජික	කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින්

*ඉංග්‍රීසි පිටපතෙහි අත්සන් සටහන් කර ඇත.

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යාවලින් අඩු කිරීම් නිරූපණය වේ. 10 වැනි පිටුව සිට 23වැනි පිටුව දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

දෙසැම්බර් මස **31**වැනි දිනට	සටහන	**2020** රු.	**2019** රු.
ආදායම			
භාණ්ඩාගාරයෙන් ලැබූ පුනරාවර්තන ප්‍රදාන		12,851,000	9,051,000
වි.වි.කොා.ස. ලැබූ පුනරාවර්තන ප්‍රදාන		-	2,000,000
උත්පාදිත ආදායම	**13**	1,086,333	-
වෙනත් ආදායම්	**14**	255,465	21,317
ආදායම ක්‍රමක්ෂය	**15**	825,584	594,869
මුළු ආදායම		**15,018,382**	**11,667,186**
මෙහෙයුම් වියදම්			
සේවක පඩිනඩි	**16-A**	7,809,970	6,283,317
ගමන් සහ යැපීම් දීමනාව	**16-B**	32,181	300
සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ	**16-C**	375,752	232,702
නඩත්තු වියදම්	**16-D**	-	37,780
කොන්ත්‍රාත් සේවා	**16-E**	2,947,201	3,733,387
වෙනත් පුවරාවර්තන වියදම්	**16-F**	1,655,994	1,231,360
ක්ෂය	**16-G**	825,584	594,870
මුළු මෙහෙයුම් වියදම්		**13,646,682**	**12,113,716**
පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ (හිඟය)		**1,371,700**	**(446,530)**

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය

සමකොටස්/ ශුද්ධ වත්කම්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය

2020 දෙසැම්බර් මස 31වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා

(රු.)

	සමුච්චිත අරමුදල	වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන	වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන	MOHEවලින් ප්‍රාග්ධන ප්‍රදාන	**එකතුව**
2019 ජනවාරි මස 01වැනි දිනට ශේෂය	-	-	-	-	-
ප්‍රදාන ක්‍රමක්ෂය	-	(238,780)	-	(356,089)	(594,869)
ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන	-	-	6,100,000	9,115,467	15,215,467
වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන	-	2,957,406	(2,957,406)	-	-
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ (හිඟය)	(446,530)	-	-	-	(446,530)
2019 දෙසැම්බර් මස 31වැනි දිනට ශේෂය	**(446,530)**	**2,718,626**	**3,142,594**	**8,759,378**	**14,174,068**
ප්‍රදාන ක්‍රමක්ෂය	-	(469,495)	-	(356,089)	(825,584)
ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන	-	-	500,000	-	500,000

වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන	-	1,220,346	(1,220,346)	-	-
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ (හිඟය)	1,371,700	-	-	-	1,371,700
2020 දෙසැම්බර් මස 31වැනි දිනට ශේෂය	**925,170**	**3,469,477**	**2,422,248**	**8,403,288**	**15,220,184**

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් මස 31වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2020 Rs.**	**2019 Rs.**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් (භාවිතා කළ) මූල්‍ය ප්‍රවාහය		
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්තය/ (හිඟය)	1,371,700	(446,530)
ගැලපීම්		
මූල්‍ය නොවන සංචලන		
දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම	825,584	594,870
පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම	930,827	438,776
පොළී ආදායම	(228,267)	(9,305)
ආදායම ක්‍රමක්ෂය	(825,584)	(594,869)
මෙහෙයුම්වලින් අතිරික්තය / (හිඟය)	**2,074,261**	**(17,059)**
බඩු තොගවල (වැඩිවීම) / අඩුවීම	21,498	(117,133)
ජංගම වත්කම්වල (වැඩිවීම)/ අඩුවීම	2,635,938	1,703,660
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ	**4,731,697**	**1,569,468**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් (භාවිතා කළ) මූල්‍ය ප්‍රවාහය		
දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම	(1,206,746)	(2,916,056)
කාර්ය මණ්ඩලයට ණය ගෙවීම්	(287,400)	(400,000)
කාර්ය මණ්ඩලයෙන් ණය ආපසු අය කර ගැනීම්	140,333	60,000
ස්ථීර තැම්පතුවල ආයෝජනය	(1,500,000)	-
අරමුදල් කළමනාකරණ ගිණුමෙන් පොළී ආදායම	223,984	9,305
ආයෝජන ක්‍රියාකාරකම්වලින් (භාවිතා කළ) ශුද්ධ මූල්‍ය ප්‍රවාහ)	**(2,629,828)**	**(3,246,751)**

මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රකාශනය

වසර සඳහා ප්‍රාග්ධන ප්‍රදාන	500,000	13,100,000
මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ	**500,000**	**13,100,000**
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)	2,601,869	11,422,717
වසර ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ	11,422,717	-
වසර අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ	**14,024,586**	**11,422,717**
මුදල් හා මුදල් සමාන දෑ:		
මුදල් හා බැංකු ශේෂ (සටහන 3)	**14,024,586**	**11,422,717**

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
මූල්‍ය සාධනයේ අයවැය සමඟ සංසන්දනාත්මක ප්‍රකාශනය

දෙසැම්බර් මස 31වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2020 තථ්‍ය රු.	2020 අයවැය රු.
ආදායම			
භාණ්ඩාගාරයන් ලැබුනු පුනරාවර්තන ප්‍රදාන		12,851,000	18,260,000
වි.වි.ප්‍ර.කොා.ස. ලැබුනු පුනරාවර්තන පුතිලාභ		-	-
උත්පාදිත ආදායම	**13**	1,086,333	-
වෙනත් ආදායම	**13**	255,465	-
ආදායම් ක්‍රමක්ෂය	**14**	825,584	-
මුළු ආදායම		**15,018,382**	**18,260,000**
මෙහෙයුම් ආදායම			
සේවක පඩිනඩි	**16-A**	7,809,970	10,370,000
ගමන් සහ යැපීම් දීමනාව	**16-B**	32,181	100,000
සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ	**16-C**	375,752	860,000
නඩත්තු වියදම්	**16-D**	-	260,000
කොන්ත්‍රාත් සේවා	**16-E**	2,947,201	3,555,000
වෙනත් පුවරාවර්තන වියදම්	**16-F**	1,655,994	3,115,000
ක්ෂය	**16-G**	825,584	-
මුළු මෙහෙයුම් වියදම්		**13,646,682**	**18,260,000**
පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ (හිඟය)		**1,371,700**	

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය

2020 දෙසැම්බර් මස **31වැනි** දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

1. සාමාන්‍ය තොරතුරු

1.1 නෛතික සහ ආයතනික ස්ථාපනය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 ඒ වගන්තිය සමඟ කියවිය යුතු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් 2017 අංක 05 දරන ආඥා පනතේ 18වැනි වගන්තිය මඟින් පිහිටුවන ලද අතර 2017 අංක 2031/38 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. විද්‍යායතනය කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් වන අතර ආඥා පනතේ විස්තර කළ 2019 පෙබරවාරි මස එහි කටයුතු ආරම්භ කරන ලදී. විද්‍යායතනයේ කාර්යාලය බොරැල්ල, කොටා පාර, ආයුර්වේද ශික්ෂණ රෝහලේ 5වැනි මහළේ තාවකාලිකව ස්ථාපනය කර ඇත. 2020 දෙසැම්බර් මස 31වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය, සමකොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රවාහන ප්‍රකාශනය 2021 පෙබරවාරි මස 23 වැනි දින කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

1.2 මූල්‍ය කාලපරිච්ඡේදය

ආයතනයේ මූල්‍ය කාලපරිවඡේදය 2020 ජනවාරි මස 01වැනි දින සිට 2020 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වේ.

1.3 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

(අ) ආයතනයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව මඟින් අනුමත කරන පරිදි ආයුර්වේදය, යුනානි සහ සිද්ධ වෛද්‍ය ක්‍රම පිළිබඳ විශේෂඥ ක්ෂේත්‍ර පිළිබඳ පශ්චාත් උපාධි උපදේශනය, පුහුණුව සහ පර්යේෂණ සඳහා ශිෂ්‍යයින් බඳවා ගැනීම සහ එම සේවා සැපයීම.

(ආ) විශ්වවිද්‍යාලයේ අනුමැතිය සහ කොමිෂන් සභාවේ එකඟතාව ඇතිව ආයුර්වේදය, යුනානි සහ සිද්ධ වෛද්‍ය ක්‍රම හෝ අදාළ විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා පශ්චාත් උපාධි සහතිකපත්‍ර සහ වෙනත් අධ්‍යයන විශිෂ්ටතා පිරිනැමීමට තීරණය කිරීම.

(ඇ) විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව ආයුර්වේදය, යුනානි සහ සිද්ධ වෛද්‍ය ක්‍රම හෝ අදාළ විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂඥතා අත්කර ගත් තැනැත්තන් තීරණය කිරීමේ කාර්ය සඳහා පශ්චාත් උපාධි පර්යේෂණ පැවැත්වීම සහ පර්යේෂණ සමත්ව සිටින සහ ආයතනයේ අදහස් විමසා, විශ්වවිද්‍යාලය මඟින්

නියම කරන අනු-නීති අනුව වෙනත් කොන්දේසි සපුරා ඇති, ඒ අනුව විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා පශ්චාත් උපාධි සහතිකපත්‍ර සහ වෙනත් අධ්‍යයන විශිෂ්ටතා ප්‍රදානය කිරීමට සුදුසුකම් සපුරාලන තැනැත්තන් පිළිබඳව විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම.

(ඈ) ආයතනයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් විශ්වවිද්‍යාලය හෝ ආයතන සමඟ ගුරු, ශිෂ්‍ය සහ විද්වතුන් හුවමාරු කර ගැනීම හෝ වෙනත් ආකාරයකින් සහයෝගිතා ඇති කර ගැනීම.

1.4 කෙරී ගෙන යන වැඩ

මූල්‍ය ප්‍රකාශන කෙරී ගෙන යන වැඩ පදනම මත සකස් කර ඇත.

1.5 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

1.5.1 අනුකූලතා ප්‍රකාශනය

2 දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය මඟින් නිකුත් කළ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPSAS) අනුකූලව ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

3 මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශනය, සමකොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඇතුළත් වේ.

4 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී යොදා ගත් මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත.

4.1.1 තක්සේරු කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇති අතර යෝග්‍ය අවස්ථාවල දී අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම් සම්බන්ධයෙන් යෝග්‍ය හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

4.1.2 තුලනාත්මක තොරතුරු

2019 වසරේ පෙර වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා තුලනාත්මක සංඛ්‍යා හෙළිදරව් කර ඇත.

4.1.3 වැදගත්භාවය සහ සමූහනය

සමාන අයිතමවල සෑම වැදගත් පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙනම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයේ හෝ කාර්යයන් ඇති අයිතම වැදගත් නොවන්නේ නම් මිස වෙනම ඉදිරිපත් කර ඇත.

4.1.4 හිලව් කිරීම

SLPSAS මඟින් අවශ්‍ය කර හෝ අවසර දී ඇත්තේ නම් මිස වත්කම් හා වගකීම් සහ ආදායම හා වියදම හිලව් කිරීම සිදු කර නොමැත.

4.1.5 වාර්තාකරණ දිනයට පසු සිදුවීම්

වාර්තා කරන දිනයට පසුව එළැඹෙන සියලුම වැදගත් සිදුවීම් සලකා බලන ලදුව අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනවල නිසි ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

4.1.6 කෘත්‍ය සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් වර්ගය

මෙම මූල්‍ය ප්‍රකාශන ආයතනයේ ඉදිරිපත් කිරීමේ සහ ව්‍යවහාර මුදල් වර්ගය වන "ශ්‍රී ලංකා රුපියල්" (Rs.) වලින් සකස් කර ඉදිරිපත් කර ඇත.

4.1.7 වටැයීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල අවසර දී ඇති පරිදි වෙනත් ආකාරයකට දක්වා ඇත්තේ නම් මිස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අගයන් ආසන්න රුපියලට වටයා ඇත.

4.1.8 වැදගත් ගිණුම්කරන ඇස්තමේන්තු සහ නීණ්දු

ගිණුම්කරණ ඇස්තමේන්තු සහ වැදගත් නීණ්දුවල කිසියම් වෙනස්කමක් මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

2.1 ජංගම වත්කම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වර්ගීකරණය කර ඇති ජංගම වත්කම් මූල්‍ය ප්‍රකාශනයේ දිනයෙන් වසරක් ඇතුළත ආපසු අය කර ගනු ලැබේ.

2.1.1 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑවලට අතැති මුදල්, බැංකු ශේෂ සහ කෙටි කාලීන ආයෝජන ඇතුළත් වේ. 2019 වසරේ දී ප්‍රාග්ධන ප්‍රදානයක් ලෙස උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුනු රු. 7,000,000.00 2019 වසරේදී අරමුදල් කළමනාකරණ අරමුදලට මාරු කරන ලද අතර වසර තුළ දී උපයා ගත් පොළිය රු. 223,984.29 වේ.

2.1.2 ස්ථිර තැම්පතුවල ආයෝජනය

අභ්‍යන්තර ආදායමෙන් ලැබූ රු. 1,500,000.00ක මුදල වර්තන මූල්‍ය වර්ෂය තුළ දී රු. 500,000.00 බැගින් වූ මාස තුනක ස්ථිර තැන්පතු තුනක ආයෝජනය කරන ලදී. වසර තුළ දී ලැබූ පොළිය රු. 4,282.80ක් විය.

2.1.3 භාණ්ඩ ලේඛන සහ තොග

භාණ්ඩ ලේඛන පිරිවැය අඩු සහ ශුද්ධ හඳුනාගැනීමේ වටිනාකමට දක්වා ඇත. සාමාන්‍යයෙන් පිරිවැය පළමුව එන පළමුව යන පදනමට තීරණය කරනු ලබන අතර භාණ්ඩ ලේඛන අත්කර ගැනීමට දැරූ වියදම සහ ඒවා පවතින තත්ත්වයට හා ස්ථානයට ගෙන ඒමට දැරූ වියදම ඇතුළත් වේ.

ලිපි ද්‍රව්‍ය හා වෙනත් පාරිභෝගික අයිතම ආයතනයේ බඩු ලේඛනවලට ඇතුළත් වේ.

2.2 ජංගම නොවන වත්කම්

2.2.1 දේපළ, පිරියත හා උපකරණ

කාර්යාල හා ඉගැන්වීම් උපකරණ, ගෘහභාණ්ඩ හා සවිකිරීම්, පරිගණක හා පරිගණක මෙවලම් සහ වෙනත් වත්කම් රජයේ ප්‍රදානවලින් අත්කර ගත් අයිතමවලට ඇතුළත් වේ.

කොළඹ විශ්වවිද්‍යාලය 2018 වසරේ දී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබූ මූලික ප්‍රදානවලින් ආයතනය සඳහා රු. 2,264,892.50 ක් වටිනා අයිතම මිල දී ගෙන ඇත. මෙම වත්කම් 2018 වසරේ දී කොළඹ විශ්වවිද්‍යාලය මඟින් ඔවුන්ගේ වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගෙන ප්‍රාග්ධනය කර ඇත. තව ද කොළඹ විශ්වවිද්‍යාලය 2018 වසර සඳහා සමුච්චිත ක්ෂයවීම් ලෙස රු. 149,425.53ක් හඳුනා ගන්නා ලදී. ඒ අනුව, 2019.01.01 වැනි දින වන විට ආයතනය මඟින් රු. 2,115,466.97 ක වටිනාකම ඇති වත්කම් ඒවායේ ශුද්ධ ලිඛිත වටිනාකම පදනම්ව හඳුනා ගෙන, ප්‍රාග්ධනය කර ඇති අතර අදාළ ප්‍රදානය වත්කම්වල ඉතිරි ප්‍රයෝජනවත් ජීවිත කාලය අතරතුර ක්‍රමක්ෂය කර ඇත.

අ) හඳුනා ගැනීමේ සහ මැනීමේ පදනම

දේපළ, පිරියත හා උපකරණවල අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා එන්නේ නම් සහ එහි පිරිවැය විශ්වාසනීයව මැනිය හැක්කේ නම් හඳුනා ගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැය අඩු කිරීම සමුච්චිත ක්ෂයවීම් ලෙස වාර්තා කර ඇත. දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය ඒවා මිල දී ගැනීමේ පිරිවැය සහ ඒවා සම්බන්ධ ආනුශංගික විදයම්වල එකතුව වේ.

සියලුම දේපළ, පිරියත හා උපකරණ ආරම්භයේ දී පිරිවැයට දක්වන අතර පසුව පිරිවැය අඩු කිරීම සමුච්චිත ක්ෂයවීම සහ කිසියම් අපවයවීම් අලාභ ආදියට මනිනු ලැබේ. අළුත්වැඩියා කිරීමේ සහ නඩත්තු පිරිවැය ඒවා දරන ලද ආකාරයට විස්තීරණ ආදායම ප්‍රකාශනයේ දක්වා ඇත.

ආ) මූලික පිළිගැනීම

වත්කම් ස්වභාවික පදනම මත මුදල් බවට හරවා ඇත. වත්කම් අස්පර්ශනීය, වසරකට වැඩි ජීවිත කාලයක් තිබීම සහ සැලකිය යුතු පිරිවැයක් තිබීම මත මුදල් බවට හරවා ඇත. වත්කමේ ජීවිත කාලය වසර 5 සිට 20 දක්වා එහි කාණ්ඩය අනුව රඳා පවතී.

ඇ) පවතින ස්ථාවර වත්කම්වල පසුකාලීන පිරිවැය

ස්පර්ශනීය, ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් දැරූ වියදම පහත දැක්වෙන නිර්ණායක සපුරාලන්නේ නම් මිස ඒවා දැරූ කාලපරිච්ඡේදය තුළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා ඇති අතර අදාළ පදනම මත ප්‍රාග්ධනය කොට, ක්ෂය කරනු ලැබේ.

- ස්ථාවර වත්කම්වල වෙළඳපොළ වටිනාකම පසුව වැඩි කර ඇත
- වත්කම් ධාරිතාව ඉහළ දැමීම.
- නිමැවුමේ ගුණාත්මකභායේ තිරසර වැඩිදියුණු කිරීම හෝ මෙහෙයුම් පිරිවැයේ අඩුවීම.
- අළුත්වැඩියා කිරීම සහ නඩත්තුව මඟින් තහවුරු කර ඇති කාලසීමාව ඉක්මවා වත්කමේ ජීවිත කාලය සැලකිය යුතු ලෙස දීර්ඝ කිරීම.

ඇ) **ක්ෂයවීම**

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රයෝජනය සඳහා පත් කළ දිනයේ සිට ඒවායේ ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට සරල රේඛීය පදනම මත මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කර ඇත. ඉඩම් ක්ෂය කරනු නොලැබේ. ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලපරිච්ඡේදයන් පහත දැකවෙන පරිදි වේ

විස්තරය	**ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලය**
කාර්යාල හා ඉගැන්වීම් උපකරණ	වසර 10
පරිගණක හා පරිගණක මෙවලම්	වසර 5
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	වසර 10

ක්ෂයවීම් භාවිතා කළ කාලපරිච්ඡේදය මත පදනම්ව, මිල දී ගත් දින සිට අපහරණ දිනය දක්වා දක්වා ඇත. කොළඹ විශ්වවිද්‍යාලයෙන් මාරු කළ වත්කම් එම විශ්වවිද්‍යාලය මඟින් 2018 දෙසැම්බර් මස 31වැනි දින දක්වා ක්ෂය කර ඇති බැවින් 2019.01.01 දින සිට ක්ෂය කරනු ලැබේ.

2.3 වගකීම් සහ ප්‍රතිපාදන

2.3.1 ජංගම වගකීම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් නම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයේ සිට වසරක කාලයක් තුළ ගෙවීමට ඇති වගකීම් වේ. දන්නා සියලුම වගකීම් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී ගණනය කර ඇත.

2.3.2 විලම්භිත ආදායම

පාඨමාලා සහ අධ්‍යයන වැඩසටහන්වලට අදාළ ලැබීම් පාඨමාලා ආරම්භයේ දී එක්රැස් කරන විට සහ පාඨමාලා පැවැත්වීම මාස කිහිපයක කාලපරිච්ඡේදයකින් සිදු කරන විට විලම්භිත ආදායම ඇති වේ. පාඨමාලාව පවත්වනු ලබන කාලසීමාව දක්වා විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනයේ දී ආදායම හඳුනා ගන්නා අතර පාඨමාලාවේ ඉතිරි කාලපරිච්ඡේදයට අදාළ ශේෂය, ආදායම හඳුනා ගන්නා තෙක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වගකීමක් ලෙස විලම්භිත ආදායම ලෙස හඳුනා ගනී.

2.3.3 විශ්‍රාම ප්‍රතිලාභ සඳහා විධිවිධාන

සේවක ප්‍රතිලාභ

(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂිකය

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සේවකයෙක් විශ්‍රාම යන විට ලැබෙන ප්‍රතිලාභ අගය ඇස්තමේන්තු කරනු ලබයි. 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීම් පනත යටතේ විශ්වවිද්‍යාලය මගින් ප්‍රතිලාභ සැලැසුම භාවිතා කරනු ලැබේ.

එය සේවකයාගේ වයස, සේවා කාලය සහ වන්දි යන සාධක මත තීරණය වේ. මෙම වගකීම සපුරාලීම සඳහා අභ්‍යන්තර කළමනාකරණ ඇගයීම මත පදනම්ව ගණනය කළ අගය වාර්තා කරන දිනයට විධිවිධානයක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, වාර්තා කරන දිනට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වසර 5ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයින් සඳහා වගකීම හඳුනා ගන්නා ලදී. කාලපරිච්ඡේදය ආරම්භයේ දී ඉදිරියට ගෙන ආ විධිවිධාන සහ කාලපරිච්ඡේදය අවසානයේ දී ඉදිරියට ගෙන ආ විධිවිධින අතර වෙනස ලාභය සහ අලාභය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත.

පරතෝෂිත වගකීම සඳහා බාහිරින් අරමුදල් සැපයීම හෝ ජීවගණක තක්සේරුවක් සිදු නොවේ.

(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුම ආයතනයක් විසින් වෙනස් ආයතනයක් වෙත ස්ථාවර දායකත්වයක් ගෙවනු ලබන පසු-සේවානියුක්ති සැලසුමක් වන අතර වැඩිපුර අගයක් ගෙවීම සඳහා කිසිදු නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් නොමැත. නිශ්චිත දායකත්ව සැලසුම්වලට දායකත්වය ගෙවීම සඳහා වූ බැඳීම ඒවා ගෙවිය යුතු අවස්ථාවල දී විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනයේ වියදමක් ලෙස දක්වා ඇත.

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (UPF) සහ විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල

ශ්‍රී ලංකාවේ ඇති අදාළ ව්‍යවස්ථා, නීති සහ විශ්වවිද්‍යාල පනත අනුව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සඳහා ආයතනය විසින් 15%ක දායකත්වයක් සහ සේවකයින් විසින් ඔවුන්ගේ දළ වැටුපෙන් 7% සහ 10% ලෙස දායකත්වය දක්වයි. එමෙන්ම විශ්වවිද්‍යාලය විශ්‍රාම යන සේවකයින් වෙනුවෙන් විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදලය 8%ක දායකත්වයක් ද දක්වයි .

සේවක ප්‍රතිලාභ සේවක භාරකාර අරමුදල (ETF)

විශ්වවිද්‍යාලය සෑම සේවකයෙක්ගේම දළ වැටුපෙන් 3%ක් සේවක භාරකාර අරමුදලට දායකත්වය දක්වයි.

2.3.4 අසම්භාව්‍ය බැරකම්

නඩු කටයුතුවලින් ඇති වූ වගකීම් සම්බන්ධයෙන් කිසිදු විධිවිධානයක් ගිණුම්ගත කර නොමැත. 2020 දෙසැම්බර් මස 31වැනි දිනට ඇති ඇස්තමේන්තුගත සියලුම වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත.

2.4 සමකොටස්

2.4.1 ප්‍රාග්ධන ප්‍රදාන

රජයේ ප්‍රදාන ලැබීමේ සහ සියලුම කොන්දේසිවලටඅනුකූලවීමේ යුක්තිසහගත සහතිකවීම මත රජයේ ප්‍රදාන හඳුනා ගනු ලැබේ.

ස්ථාවර වත්කම් මිල දී ගැනීම සඳහා වූ රජයේ ප්‍රදාන සහ වෙනත් සංවිධානවලින් ලැබෙන දායකත්වය පළමු වැනි අවස්ථාවේ දී ලැබූ ප්‍රදාන ලෙස සලකනු ලැබේ. වත්කම් මිල දී ගැනීම සඳහා උපයෝජනය කර ගැනීම මත ඒවා වැය නොකළ ප්‍රාග්ධන ගිණුමට ඇතුළත් කරන අතර එසේ නැතහොත් වියදම් කළ වත්කම් මිල දී ගැනීම සඳහා ආදායමට හෝ වියදමට ඇතුළත් කරනු ලැබේ.

2.4.2 පුනරාවර්තන ප්‍රදාන

පුනරාවර්තන ප්‍රදාන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ මූල්‍ය පදනම මත හඳුනා ගනී. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූලික පුනරාවර්තන වියදම් පියවා ගැනීම සඳහා 2019 වසරේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ලැබූ මූලික පුනරාවර්තන ප්‍රදානය වූ රු. 2,000,000.00 ක මුදල 2019 වසරේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ලැබූ ආදායමක් ලෙස හඳුනා ගන්නා ලදී. එමෙන්ම 2019 වසරේ දී පුනරාවර්තන ලෙස භාණ්ඩාගාරයෙන් ලැබූ ප්‍රදානය වන රු. 9,051,000.00 සහ 2020 වසරේ දී ලැබූ ප්‍රදානය වන රු. 12,851,000.00 ආදායම ලෙස හඳුනා ගනී.

ප්‍රදාන සඳහා ගිණුම්ගත කිරීම

දැරූ වියදම් සඳහා විශ්වවිද්‍යාලයට ගෙවනු ලබන ප්‍රදාන වියදම් හඳුනාගත් කාලපරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ. වත්කමක පිරිවැය සඳහා විශ්වවිද්‍යාලයට ගෙවනු ලබන ප්‍රදාන අදාළ වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට ක්‍රමානුකූල පදනමක් මත ආදායම ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුව විශ්වවිද්‍යාල 20ක් විසින් ප්‍රාග්ධන ප්‍රදාන හඳුනා ගැනීමේ දී ආදායම් ප්‍රවේශ ගිණුම්කරණ මූලධර්මය යොදා ගනී.

2019 වසරේ දී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබූ මූලික ප්‍රාග්ධන ප්‍රදානය රු. 7,000,000.00 ක් වන අතර 2019 වසරේ දී ප්‍රාග්ධන ප්‍රදාන ලෙස භාණ්ඩාගාරයෙන් ලැබුනු ප්‍රදාන රු. 6,100,000.00ක් විය මෙම ප්‍රදාන දෙක 2019 වසරේ දී ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන දෙකක් ලෙස වෙනම දක්වා ඇති අතර ඒ අනුව ක්‍රමක්ෂය කර ඇත. මෙයට අමතරව, 2019 වසරේ දී කොළඹ විශ්වවිද්‍යාලයෙන් මාරු කළ වත්කම් පදනම්ව MOHEවලින් ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු. 2,115,466.97 ක් හඳුනා ගෙන ඒ අනුව ක්‍රමක්ෂය කර ඇත.

2020 වසර අතරතුර දී භාණ්ඩාගාරයෙන් ලැබුනු ප්‍රාග්ධන ප්‍රදානය රු. 500,000.00ක් වන අතර වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදානය ලෙස හඳුනා ගනී.

2.5 විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනය

2.5.1 ආදායම හඳුනාගැනීම

ගෙවීම් සිදු කළ දිනය නොසලකා ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ හැකියාව සහ ආදායම විශ්වාසදායක ලෙස මැනීමේ හැකියාව අනුව ආදායම හඳුනා ගනු ලැබේ. ආදායම හඳුනා ගැනීමට පෙර පහත දැකවෙන හඳුනාගැනීම් නිර්ණායක ද සම්පූර්ණ කළ යුතුය.

01. පාඨමාලාවලින් ආදායම

විශේෂ වෛද්‍ය උපාධිවලින් ආදායම කලින් කළ පදනම මත ආදායම ලෙස හඳුනා ගනී. 2020 වසරේ දී විශේෂඥ වෛද්‍ය උපාධි පහක් ආරම්භ කරන ලදී. 2020 වසරේ දී ලියාපදිංචි ගාස්තුව සහ පාඨමාලා ගැස්තුව ලෙස හඳුනා ගක් මුදල රු. 2,428,000.00 ක් වූ අතර වසරේ දී උත්පාදිත අදායම රු. 1,086,333.00ක් විය.

02. පොලී ආදායම

පොලී ආදායම ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ආදායම හෝ වියදම මත උපචය වන ආකාරයට හඳුනා ගනු ලැබේ. ලැබූ පොළී ආදායම සහ ස්ථීර තැම්පතු ආයෝජනවලින් ලැබීම් මෙන්ම අරමුදල් කළමනාකරණ ගිණුමෙන් ලැබීම් පොලී ආදායමට ඇතුළත් වේ.

03. වෙනත් ආදායම

ඉහත කාණ්ඩ යටතේ විශේෂයෙන් දක්වා නොමැති වෙනත් කිසියම් ආදායමක් උපචිත පදනම මත හඳුනා ගනු ලැබේ.

2.5.2 වියදම් හඳුනා ගැනීම

ආයතනයේ සියලුම ක්‍රියාකාරකම් සිදු කිරීම සම්බන්ධ වියදම් උපචිත පදනම මත හඳුනා ගන්නා අතර ඒවා වියදම් කළ කාලපරිච්ඡේදය අතරතුර විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කර ගනු ලැබේ.

2.6 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 2 අනුව වක්‍ර ක්‍රමය භාවිතා කරමින් සකස් කරනු ලබන අතර මෙහෙයුම් කටයුතුවල දළ මූල්‍ය ලැබීම් සහ දළ මූල්‍ය ගෙවීම්, මූල්‍ය ක්‍රියාකාරකම් සහ ආයෝජන කටයුතු හඳුනා ගෙන ඇත.

2.7 වගකීම් සහ අවිනිශ්චිතතාවන්

සිතිය හැකි සියලුම අවදානම් සියලුම වගකීම්වල අගය තීරණය කිරීමේ දී ගිණුම්ගත කර ඇත. අවිනිශ්චිත වගකීම් යනු අනිවිශ්චිත අනාගත සිදුවීම්වලින් සහතික කළ හැකි වන සිදුවිය හැකි බැඳීම්

හෝ ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීම සිදු කිරීමේ හැකියාවක් නොමැති සහ විශ්වාසනීය ලෙස මැනිය නොහැකි වර්තමාන බැඳීම් වේ. අවිනිශ්චිත වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොමැති නමුත් ඒවා දුරස්ථ වන්නේ නම් මිස හෙළිදරව් කරනු ලැබේ.

2.8 වාර්තා කරන දිනයට පසු සිදුවීම්

වාර්තා කරන කාලපරිච්ඡේදයට පසුව සිදු වන සිදුවීම්වල වැදගත්කම සලකා බලා ඇති අතර අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනවලට සුදුසු ගැලපීම් සිදු කර ඇත.

සටහන 03 මුදල් හා මුදල් හා සමාන දෑ	**2020** රු	**2019** රු
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 0084061028 - පුනරාවර්තන	4,369,048	1,270,818
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 0084060859 - ප්‍රාග්ධන	494,475	142,594
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 0085283375 - අරමුදල් කළමනාකරණ ගිණුම	9,161,062	10,009,305
	14,024,586	**11,422,717**

සටහන 04 ස්ථාවර තැන්පතුවල ආයෝජන	**2020** රු	**2019** රු
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 86766165	500,000	-
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 86766175	500,000	-
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 86766156	500,000	-
	1,500,000	**-**

සටහන 05 කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම්	2021 දී ආපසු අය කර ගැනීම්	2021න් පසුව ආපසු අය කර ගැනීම්	2020 රු	2019 රු
ආපදා ණය		362,067	362,067	212,500
පරිගණක ණය	11,000	14,000	25,000	25,500
ප්‍රවාහන ණය	44,000	56,000	100,000	102,000
	55,000	**432,067**	**487,067**	**340,000**

සටහන 06 බඩු ලේඛන /තොග	2020 රු	2019 රු
තොග	95,635	117,133
	95,635	**117,133**

සටහන 07

දේපළ, පිරියත හා උපකරණ

Rs.

විස්තරය	**2019.12.31 දිනට ශේෂය**	**එකතු කිරීම්**	**ඉවත් කිරීම්/ ගැලපීම්**	**2020.12.31 දිනට ශේෂය**
කාර්යාල හා ඉගැන්වීම් උපකරණ	1,970,238	667,108	-	2,637,346
පරිගණක හා පරිගණක මෙවලම්	1,372,717	-	-	1,372,717
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	2,991,253	48,647	-	3,039,900
එකතුව	**6,334,208**	**715,755**	**-**	**7,049,963**

<u>ක්ෂයවීම් සඳහා වෙන්කිරීම්</u>

විස්තරය	%	**2019.12.31 දිනට ශේෂය**	**වසර සඳහා ගාස්තුව**	**ඉවත් කිරීම්/ ගැලපීම්**	**2020.12.31 දිනට ශේෂය**
ක්ෂය සඳහා වෙන් කිරීම - කාර්යාල හා ඉගැන්වීම් උපකරණ	10	146,427	229,304		375,731
ක්ෂය සඳහා වෙන් කිරීම - පරිගණක හා මෙවලම්	20	278,424	292,510		570,934
ක්ෂය සඳහා වෙන් කිරීම -ගෘහභාණ්ඩ හා සවිකිරීම්	10	170,019	303,770		473,789
එකතුව		**594,870**	**825,584**	**-**	**1,420,454**

ලියාහල අගය

විස්තරය	31.12.2019 දිනට ශේෂය	එකතු කිරීම්	ඉවත් කිරීම්/ ගැලපීම්	31.12.2020 දිනට ශේෂය
කාර්යාල හා ඉගැන්වීම් උපකරණ	1,823,810	-	-	2,261,614
පරිගණක හා පරිගණක මෙවලම්	1,094,294	-	-	801,784
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	2,821,234	-	-	2,566,111
එකතුව	**5,739,339**	**-**	**-**	**5,629,510**

සටහන 08 සමුච්චිත වියදම්	2020 Rs.	2019 Rs.
සමුච්චිත වියදම්-පුනරාවර්තන	2,878,956	1,689,383
එකතුව	**2,878,956**	**1,689,383**

සටහන 09 ගෙවිය යුතු දේ	2020 Rs.	2019 Rs.
ණයකරුවෝ	774,900	1,302,685
රඳවාගැනීම්	143,195	-
ගෙවිය යුතු මුද්දර ගාස්තු	575	900
PAYE බදු ගෙවීම	-	13,377
ගෙවිය යුතු රැස්වීම් දීමනාව	12,000	-
එකතුව	**930,670**	**1,316,962**

සටහන 10 විශ්‍රාම පාරිතෝෂිකය සඳහා ගෙවීම	2020 Rs.	2019 Rs.
ජනවාරි -1 දිනට ශේෂය	438,776	-
වර්ෂය සඳහා ගාස්තුව	930,827	438,776
	1,369,603	438,776
වර්ෂය තුළ ගෙවීම්	-	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,369,603**	**438,776**

සටහන 11 ප්‍රාග්ධන ප්‍රදාන	2020 Rs.	2019 Rs.
ගෙවූ ප්‍රාග්ධන ප්‍රදාන	3,469,477	2,718,626
නොගෙවූ ප්‍රාග්ධන ප්‍රදාන	2,422,248	3,142,594
MOHEවලින් ප්‍රාග්ධන ප්‍රදාන	8,403,288	8,759,378
	14,295,013	**14,620,597**

සටහන12 සමුච්චිත අතිරික්තය සහ හිඟය	2020 Rs.	2019 Rs.
ජනවාරි -1 දිනට ශේෂය	(446,530)	-
ගැලපීම් (පෙර වර්ෂය)	-	-
කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය /(හිඟය)	1,371,700	(446,530)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**925,170**	**(446,530)**

සටහන 13 උත්පාදිත ආදායම්	2020 Rs.	2019 Rs.
විශේෂඥ උපාධි ලියාපදිංචි ගාස්තුව	128,000	-
විශේෂඥ උපාධි පාඨමාලා ගාස්තුව	958,333	-
එකතුව	**1,086,333**	**-**

සටහන 14 වෙනත් ආදායම්	2020 Rs.	2019 Rs.
ණය හා අත්තිකාරම්වලින් පොළිය	27,198	12,012
අරමුදල් කළමනාකරණ ගිණුමෙන් පොළිය	223,984	9,305
ස්ථිර තැන්පතුවලින් පොළිය	4,283	-
එකතුව	**255,465**	**21,317**

සටහන 15 ආදායම් ක්‍රමක්ෂය	2020 Rs.	2019 Rs.
ආදායම් ක්‍රමක්ෂය - රජයේ ප්‍රාග්ධන ප්‍රදාන (වත්කම්)	469,495	238,780
ආදායම් ක්‍රමක්ෂය - MOHEවලින් ප්‍රාග්ධන ප්‍රදාන (වත්කම්)	356,089	356,089
එකතුව	**825,584**	**594,869**

මුළු විදයම්

සටහන 16 -අ **පෞද්ගලික පාරිශ්‍රමික**	**2020** **රු.**	**2019** **රු.**
<u>අධ්‍යයන</u>		
වැටුප් හා වේතන	862,708	1,918,967
බාහිර කථිකාචාර්ය ගාස්තුව	171,450	-
එකතුව	**1,034,158**	**1,918,967**
<u>අධ්‍යයන-නොවන</u>		
වැටුප් හා වේතන	3,349,301	3,011,116
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	423,536	155,237
විශ්‍රාම වැටුප්	199,311	73,053
සේවක භාර අරමුදල	74,742	27,395
මාසික හිලව් දීමනාව	717,513	260,515
නිවාඩු දීමනා	25,919	6,127
පාරිතෝෂිකය	930,827	438,776
පර්යේෂණ දීමනා	556,368	202,623
ජීවන වියදම් දීමනාව	179,400	73,723
අතිරේක දීමනාව 20%	318,895	115,785
එකතුව	**6,775,812**	**4,364,350**
එකතුව	**7,809,970**	**6,283,317**

සටහන 16 -ආ **ගමන් වියදම් හා යැපීම් දීමනාව**	**2020** **රු.**	**2019** **රු.**
දේශීය	32,181	300
එකතුව	**32,181**	**300**

සටහන 16 -ඇ සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ	2020 රු.	2019 රු.
ලිපි ලේඛන හා කාර්යාල අවශ්‍යතා	305,554	155,814
ඉන්ධන හා ලිහිසි තෙල්	45,548	60,363
වෙනසත් සැපයුම්	24,650	16,525
එකතුව	**375,752**	**232,702**

සටහන 16 - ඈ නඩත්තු වියදම්	2020 රු.	2019 රු.
ගොඩනැගිලි හා ව්‍යුහය	-	37,780
එකතුව	**-**	**37,780**

සටහන 16 - ඉ කොන්ත්‍රාත් සේවා	2020 රු.	2019 රු.
විදුලි සංදේශ	130,399	93,582
තැපැල් ගාස්තු	16,855	4,640
විදුලිබලය	480,000	450,000
ආරක්ෂක සේවාව	178,280	414,972
ජලය	180,000	200,000
පිරිසිදු කිරීමේ සේවාව	228,666	595,148
කුළී හා කුලියට ගැනීමේ ගාස්තු	1,487,820	1,740,629
මුද්‍රණය හා දැන්වීම් ප්‍රචාරණය	245,182	234,416
එකතුව	**2,947,201**	**3,733,387**

සටහන 16 - ඊ වෙනත් පුනරාවර්තන වියදම්	2020 රු.	2019 රු.
විශේෂ සේවා - කවුන්සිලය හා කමිටු	974,194	878,390
වැඩමුළුව සහ සම්මන්ත්‍රණ	10,050	-
විශේෂ සේවා - වෘත්තීය හා වෙනත් සේවා	470,000	340,000

කාර්ය මණ්ඩල සංවර්ධනය හා පුහුණුව	-	5,870
දේපළ ණය පොලී සහනාධාරය	177,463	-
බැංකු ගාස්තු	4,250	7,100
දායකත්වය සහ සාමාජික ගාස්තු	16,000	-
විභාග ගාස්තු	4,037	-
එකතුව	**1,655,994**	**1,231,360**

සටහන 16 -ඌ **ක්ෂය වියදම්**	**2020** රු.	**2019** රු.
ක්ෂය - කාර්යාල හා ඉගැන්වීම් උපකරණ	229,304	146,427
ක්ෂය - ගෘහභාණ්ඩ හා සවිකිරීම්	303,770	170,019
ක්ෂය - පරිගණක හා පරිගණක මෙවලම්	292,510	278,424
එකතුව	**825,584**	**594,870**

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

2020 දෙසැම්බර් මස 31 දිනට ශේෂ පිරික්සුම

කේතය හා ගිණුම් අංකය		හර	බැර
30010 - පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම		-	1,369,603.13
30100 - ණයකරුවෝ		-	774,899.97
30110 - උපචිත වියදම් - පුනරාවර්තන		-	2,878,956.10
30120 - ගෙවිය යුතු මුද්දර ගාස්තු		-	575.00
30150 - ගෙවිය යුතු රැස්වීම් දීමනාව		-	12,000.00
30160 - ක්ෂයවීම් සඳහා වෙන්කිරීම් කාර්යාල හා ඉගෙනුම් උපකරණ		-	375,731.21
30170 - ක්ෂයවීම් සඳහා වෙන්කිරීම් පරිගණක හා මෙවලම්		-	570,933.51
30180 - ක්ෂයවීම් සඳහා වෙන්කිරීම් ගෘහභාණ්ඩ හා සවිකිරීම්		-	473,788.99
30190 - විලම්භිත ආදායම විශේෂඥ වෛද්‍ය උපාධි පාඨමාලා ගාස්තුව			1,341,666.67
20050 -ගෘහභාණ්ඩ හා සවිකිරීම්		3,039,900.44	-
20060 - කාර්යාල හා ඉගෙනුම් උපකරණ		2,637,345.54	-
20070 - පරිගණක හා පරිගණක මෙවලම්		1,372,717.44	-
20200 - බඩු ලේඛන		95,634.81	-
20210 - ආපදා ණය		362,066.60	-
20220 - ප්‍රවාහන ණය		100,000.00	-
20230 - පරිගණක ණය		25,000.00	-
20235 - ලැබිය යුතු පොළී ආදායම		4,282.80	
20240 - අත්තිකාරම්		-	-
20245 -සුළු මුදල් අග්‍රිමය		-	-
20250 - BOC බොරැල්ල SG ගිණුම් අංකය: 0084061028 - පුනරාවර්තන		4,369,048.46	-
20260 - BOC බොරැල්ල SG ගිණුම් අංකය: 0084060859 -ප්‍රාග්ධනය		494,475.02	-
20270 - BOC බොරැල්ල SG ගිණුම් අංකය: 0085283375 - අරමුදල් කළමනාකරණ ගිණුම		9,161,062.08	-

20280 - ස්ථිර තැම්පතු ආයෝජනය - BOC බොරැල්ල SG		1,500,000.00	-
10010 - වැටුප් හා වේතන		862,708.01	-
10080 - බාහිර කථිකාචාර්ය ගාස්තු		171,450.00	
10510 - වැටුප් හා වේතන		3,349,301.06	-
10520 - විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල		423,535.90	-
10530 - විශ්‍රාම වැටුප		199,310.97	-
10540 - සේවක භාරකාර අරමුදල		74,741.66	-
10570 - නිවාඩු ගෙවීම්		25,918.88	-
10590 - ජීවන වියදම් දීමනාව		179,400.00	-
10620 - පාරිතෝෂිකය		930,827.48	-
10680 - පර්යේෂණ දීමනාව		556,367.74	-
10650 - 20% අතිරේක දීමනාව		318,894.77	-
10690 -45 % මාසික හිලව් දීමනාව		717,513.24	-
11010 - ගෘහස්ථ		32,181.00	-
12010 - ලිපි ලේඛන හා කාර්යාල අවශ්‍යතා		305,553.81	-
12020 - ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය		45,548.35	-
12070 - වෙනත්		24,650.00	-
14020 - විදුලිසන්දේශ		130,398.97	-
14030 - තැපැල් ගාස්තු		16,855.00	-
14040 - විදුලිය		480,000.00	-
14050 - ආරක්ෂක සේවා		178,279.76	-
14060 - ජලය		180,000.00	-
14070 - පිරිසිදු කිරීමේ සේවා		228,666.00	-
14080 - කුළිය හා කුලී ගාස්තු		1,487,819.80	-
14100 - මුද්‍රණය, දැන්වීම් ප්‍රචාරණය ආදිය		245,181.60	-
15020 - විශේෂ සේවා - කවුන්සිලය හා කමිටු		974,193.78	-
15030 - විශේෂ සේවා - වෘත්තීය හා වෙනත් ගාස්තු		470,000.00	-
15040 - වැඩමුළු, සම්මන්ත්‍රණ		10,050.00	-

15010 - දේපළ ණය මත පොලී සහනාධාරය		177,462.86	-
15170 - බැංකු ගාස්තු		4,250.00	-
15190 - දායකත්වය හා සාමාජික ගාස්තු		16,000.00	-
15210 - විභාග ගාස්තු		4,037.00	-
15240 - ක්ෂය - කාර්යාල හා ශික්ෂණ උපකරණ		229,304.04	-
15250 - ක්ෂය - පරිගණක හා පරිගණක මෙවලම්		292,510.00	-
15260 - ක්ෂය - ගෘහභාණ්ඩ හා සවිකිරීම්		303,770.13	-
40100 - භාණ්ඩාගාරයෙන් ලැබූ පුනරාවර්තන ප්‍රදාන		-	12,851,000.00
40120 - පොදු සංචිතය		-	(446,529.58)
30130 - රඳවා ගැනීම		-	143,194.50
40140 - භාණ්ඩාගාරයෙන් ලැබූ වියදම් කළ පුනරාවර්තන ප්‍රදාන		-	3,469,476.99
40150 - භාණ්ඩාගාරයෙන් ලැබූ වියදම් නොකළ පුනරාවර්තන ප්‍රදාන		-	2,422,247.81
40160 - MOHEවලින් ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන		-	8,403,288.47
40170 - ණය හා අත්තිකාරම් පොලී ආදායම		-	27,197.65
40180 - අරමුදල් කළමනාකරණ ගිණුමෙන් පොලී ආදායම		-	223,984.29
40190 - ක්‍රමක්ෂ ආදායම - ස්ථාවර වත්කම්		-	825,584.16
40200 - ස්ථීර තැම්පතුවලින් පොලී ආදායම		-	4,282.80
40300 - ලියාපදිංචි ගාස්තුව		-	128,000.00
40310 - පාඨමාලා ගාස්තුව		-	958,333.33
		-	-
එකතුව		**36,808,215.00**	**36,808,215.00**

6. විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } එවර්ඩ්/ජී/පීජීඅයිඅයිඑම්/ එෆ්ඒ/01/2020/03

මබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2021 අප්‍රේල්30දින

අධ්‍යක්ෂ,

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන යටතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. විගණනය උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්ව මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව නිගමනය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති/ විධානයට යොමුව	විස්තරය
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය	අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.
(ආ)	2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.
(ඇ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශ	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

ආයතනයේ අධ්‍යක්ෂ වෙනුවෙන් මාසයකට උපරිම කිලෝමීටර 3,000 ක් සඳහා රු.150,000 බැගින් ගෙවීමේ පදනම මත රියදුරකු සමඟ කුලී පදනම මත ලබාගත් මෝටර් රථයක් 2019 වර්ෂයේදී මාස 3 ක් සඳහා කිලෝමීටර් 987 ක් ද 2020 වර්ෂයේදී මාස 11ක් සඳහා කිලෝමීටර් 4,499 ක් පමණක් ධාවනය කර තිබුණි. ඒ අනුව අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා ගැනීමකින් තොරව කුලී පදනම මත ලබාගත් වාහනය ඌන උපයෝජිතව භාවිතා කිරීම හේතුවෙන් ගෙවන ලද රු. 1,742,891ක කුලීය අනාර්ථික වියදමක් වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

7. විගණකාධිපති වාර්තාවට පිළිතුර

මාගේ අංකය PGIIM/Audit/2020

ඔබේ අංකය - (ඊඩියු/බී/පිජිඅයිඅයි/එම්/එෆ්ඒ/2020)

2022 ජනවාරි 10

විගණකාධිපති

ජාතික විගණන කාර්යාලය

අංක 306/72

පොල්දූව පාර

බත්තරමුල්ල

මහත්මයාණෙනි,

තොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය පකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව *විගණකාධිපති වාර්තාව*

ඔබගේ ඉහත සමාංකය හා 2021 අප්‍රේල් 30 දින දරණ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිලිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට අදාළ පැහැදිලි කිරීම පහත ඉදිරිපත් කෙරේ.

2.2.2 **<u>නීති රීති.රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම</u>**

නීති රෙගුලාසිවලට යොමුව	විස්තරය	
(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය	අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි	UGC/CIA/F/IA Circular letters අංක දරණ චක්‍රලේඛ ලිපිය ප්‍රකාරව නව තනතුරු ඉල්ලීමට කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

(ආ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි	2021 වසර සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාගන ඇත.
(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශ	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි	2021 වසර සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රසම්පාදන කාල සටහන පිළියෙළ කර ඇත. 2021 - 2023 සඳහා තුන් අවුරුදු ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර ඇත.

2.3 <u>වෙනත් කරුණු</u>

අදාළ මෝටර් රථ සේවාව 2021.06.30 දින සිට නවතා ඇති අතර අවශ්‍යතාවය පරිදි නව ප්‍රවාහන සේවයක් ලබා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

අධ්‍යක්ෂ

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

8. තිරසර සංවර්ධනය සඳහා යෝජනාව

<u>දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය</u>

1. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM) 2019 වසරේ දී පිහිටුවනු ලැබූ අතර සෞඛ්‍ය සේවා, විශ්වවිද්‍යාල සහ පෞද්ගලික අංශය සඳහා අවශ්‍ය කරන මානව සම්පත සම්පූර්ණ කිරීම පිණිස ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. සෞඛ්‍ය ව්‍යවස්ථා සංග්‍රහයට අනුව සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද, සිද්ධ සහ යුනානි යන ප්‍රධාන විශේෂඥ ක්ෂේත්‍රවල විශේෂඥ වෛද්‍යවරු සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ආයුර්වේද, යුනානි සහ සිද්ධ ආයතන සඳහා විශේෂඥයින් සැපයීම දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වගකීම වේ. ඒ අනුව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් දිවයිනේ මිනිස් බල අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම සඳහා පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම පිණිස සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම අරමුණ ඉටු කර ගැනීම පිණිස 2020 වසරේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී. දේශීය වෛද්‍ය විද්‍යා විෂය ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් පිරිනැමීම තුළින් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය **සියලුම වයස් කාණ්ඩවල තැනැත්තන් සඳහා සෞඛ්‍යසම්පන්න දිවිපැවැත්මක් සහතික කිරීමට සහ ඔවුන්ගේ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමට** අනුබල දෙනු ලබයි.

2. ආයතනය ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය අංශය සඳහා සුදුසුකම්ලත් විශේෂඥ වෛද්‍ය උපාධිධාරීන් බිහි කිරීම පිණිස සියලුම ව්‍යායාමවල නිරත වේ. ඒ අනුව ආයතනය මඟින් තත්ත්ව සහතික වැඩසටහන් හරහා විශේෂඥ වෛද්‍ය උපාධි පුහුණුවන්නන්ගේ ඉහළම ගුණාත්මකභාවය පිණිස ශික්ෂණය පිරිනැමීමේ පරමාර්ථය ඇතිව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා තත්ත්ව සහතික මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා සැලසුම් කරමින් සිටින අතර ඒ අනුව ආයතනය මඟින් **ශ්‍රී ලංකාව තුළ ගුණාත්මක අධ්‍යාපනය වැඩිදියුණු කිරීමට සහ ජීවිත කාලය පුරා ඉගෙනුම් අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීමට** අනුග්‍රහය දක්වනු ලැබේ.

3. ආයතනය **සෑමවිටම ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය සහ සමානාත්මතාව** පවත්වා ගැනීම පිණිස පියවර ගනු ලබයි.

4. මෑතක දී පිහිටුවන ලද ආයතනයක් ලෙස දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය **සියලුම තැනැත්තන් සඳහා ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව සහ තිරසර**

කළමනාකරණය තහවුරු කිරීම පිළිබඳ ක්‍රියාවලිය දියත් කරමින් ඇත. මේ සඳහා මූලාරම්භයක් ලෙස, ආයතනය මඟින් කුණු කසළ දිරාපත් වන ද්‍රව්‍ය - වීදුරු, පොලිතීන්/ ප්ලාස්ටික් සහ කඩදාසි ආදී ලෙස වෙන් වෙන් වශයෙන් කාණ්ඩ කර, යෝග්‍ය පරිදි බැහැර කිරීම සඳහා පියවර ගෙන ඇත.

5. ආයතනය ශ්‍රී ලංකාව තුළ දේශීය වෛද්‍ය අංශය තුළ ආයුර්වේද, සිද්ධ සහ යුනානි යන ක්ෂේත්‍ර සඳහා විශේෂඥ වෛද්‍ය උපාධි පිරිනමනු ලබයි. මෙම විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් සඳහා විවිධ ජාතීන්ට අයත් පුහුණුවන්නන් සහභාගී වෙයි. මේ වන විට ආයුර්වේදය පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් පමණක් ආරම්භ කර ඇති අතර නුදුරු අනාගතයේදීම යුනානි පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් සඳහා පළමු ශිෂ්‍ය කණ්ඩායම බඳවා ගැනීම පිණිස පියවර ගෙන ඇත. තව ද, සිද්ධ පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් ද ඉතා ඉක්මනින් හඳුන්වාදීම සඳහා අවශ්‍ය මූලික කටයුතු ඉටු කරමින් තිබේ. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විවිධ ජාතීන් සහ ආගම්වලට අයත් පුහුණුවන්නන් අතර අන්‍යෝන්‍ය සුහදතාව ගොඩනැගීම පිණිස අවශ්‍ය සියලුම පියවර ගනු ලබයි.

6. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් පිරිනමනු ලබන සියලුම විශේෂඥ වෛද්‍ය උපාධිවල පශ්චාත්-විශේෂඥ උපාධි වැඩසටහනේ අවසන් වසර සඳහා එක් අවුරුදු විදේශීය පුහුණුවක් ඇතුළත් වේ. මේ සඳහා දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් වෙනත් රටවල අධ්‍යාපන ආයතන සමඟ අවබෝධාත්මක ගිවිසුම්වලට එළැඹීමට සැලසුම් කරමින් ඇත (විශේෂයෙන්ම විශේෂඥ වෛද්‍ය උපාධිධාරීන් සඳහා අවසන් වසර පුහුණුව ලබා ගැනීම පිණිස ඉන්දියාවේ උසස් අධ්‍යාපන ආයතන සමඟ ගිවිසුම්වලට එළැඹීමට අපේක්ෂා කරනු ලැබේ. මෙම ක්‍රියාවලිය හරහා දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් එහි ශිෂ්‍යයින්ට සහ කාර්ය මණ්ඩලයට ජාතික සහ අන්තර්ජාතික සබඳතා ගොඩනඟා ගැනීම සඳහා අවකාශය සලසා දෙනු ලැබේ.)